# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව


இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.slli.lk & www.lightinfantry.lk

73rd ISSUE
JULY
2012


## පරම වීර විභූෂණ පදක්කමින් පිදුම් ලැබූ පාබල හමුදාවේ නොමියන විරුවෝ





සෙ/317077
කෝප්‍රල් අබේසිංහ ඒඑම්එම්පී



සෙ/319909
ලා:කෝ දයානන්ද ටීජීඩීආර්



සෙ/197405
ලා:කෝ රත්නායක ආර්එම්ජීඑම්

සේවය කරමි වදනට නිති ගරු සරුව ඉඳ
මියයන බවක් පෙනි පෙනි පෙරමුණට වැද
තම සෙබළුනට බළකායට දිවි පිදුනු සඳ
බුහුමන් ලබයි නැතුවත් ඔබ අප අතර අද

# රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රීලපාහ හී මාණ්ඩලික ප්‍රධානි නි/60877 කර්නල් සීඩී විරසූරිය ආර්එස්පී



සුබ මොහොතින් නව තනතුර භාරගනිමින්




චිරාගත සම්ප්‍රධානුකුලව පොල්තෙල් පහන දල්වමින්

## මංගල සීනු







2012 මැයි මස 18 වන දින මහනුවර අලදෙනියේ ඩෙල්මා මවුට්විව් උත්සව ශාලාවේදී නිලූකා ඉලංගකෝන් මෙනවිය සමඟ යුග දිවියට පා තැබූ නි/66490 කපිතාන් පීපීඑම්පී ජයවර්ධන ශ්‍රීලපාහ

2012 මැයි මස 23 වන දින ඇහැලියගොඩ නිවසේදී මාලිකා දමයන්ති වීරසූරිය මෙනවිය සමඟ යුග දිවියට පා තැබූ රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශයේ සෙ/319091 කෝප්‍රල් රූපසිංහ ඊඩීඑ

2012.07.28 දින මොරටුව ශ්‍රීපාලි උත්සව ශාලාවේදී මධුෂානි ද මැල් මෙනවිය සමඟ යුග දිවියට පා තැබූ 10 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/323121 ලාකෝ පීරිස් බීඑස්එම්.

# THE WHITE HACKLE

www.slli.lk & www.lightinfantry.lk

**73rd Issue JULY 2012**

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


# CONTENTS


| | PAGE |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය | 03 |
| 6 ශ්‍රීලපාහ මියගිය හා අතුරුදහන් වූ රණවිරුවන් සැමරීම | 04 |
| 2012 අන්තර් රෙජිමේන්තු ආධුනික මළල ක්‍රීඩා තරගාවලියේ ශූරතාවය ශ්‍රීලපාහ | 05 |
| 62 වන සංවත්සරය සැමරූ 1 ශ්‍රීලපාහ | 07 |
| නොමියන පාබල විරුවෝ | 08 - 09 |
| 12 ශ්‍රීලපාහ බියුගල් නෙස්ට් නිවාඩු නිකේතනය | 12 - 13 |
| මා දුටු සැටි (කෙටි කතාව) | 14 - 15 |
| රෙම ශ්‍රීලපාහට රණවිරු බිරිඳකගෙන් තුති | 16 |
| ලේ බිඳක් පරිත්‍යාග කර දකුණත් නැගෙනහිරත් යාකළ 15 ශ්‍රීලපාහ | 17 |
| 4 ශ්‍රීලපාහ 16 වන අණදෙන නිලධාරී | 18 |
| රෙම ශ්‍රීලපාහ බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයට නව ගොඩනැගිල්ලක් | 20-21 |
| 6 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී | 22 |
| පස්වන වියට පාතැබූ 11 ශ්‍රීලපාහ | 23 |
| සම්බුදු තෙමගුල සැමරූ 24 ශ්‍රීලපාහ | 24 |
| ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ අඩවසරක ප්‍රගතිය | 25 |
| 20 ශ්‍රීලපාහ තෙවන අණදෙන නිලධාරී | 28 |
| සේවාවනිතා පුවත් | 30-31 |
| 19 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී | 32 |
| නව බුදුමැදුරක් ස්ථාපනය කල 25 ශ්‍රීලපාහ | 34 |
| රෙම ශ්‍රීලපාහ ප්‍රඩෝ සංචිතයේ ජයග්‍රහන | 37 |
| දසුනේ හසුන | 39 |
| ප්‍රහේලිකා අංක 50 | 39-40 |




17 ලොව උතුම් දාන පාරමිතාව



35 1983 ජූලි විරුවන් සැමරීම



38 ශ්‍රීලපාහ විරුදරු ජයග්‍රහන




## කවරයේ කථාව

දශක තුනක තිබූ යුද ගිනිදැල් නිවා තෙවැනි සංවත්සර විජයග්‍රාහි පෙළපාළිය 2012.05.19 දින ගාලු මුවදොර පිටියේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. එහිදි මව්බිමේ නිදහස් ලබන්නට අමිල මෙහෙවරක් කර තම දිවිය පුදකළ ශූර වීර රණවිරුවන් 15 දෙනෙකු සඳහා පරම වීර විභූෂන පදක්කමින් පිදුම් ලැබූහ. එම රණවිරුවන් අතුරින් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ රණවිරුවන් තිදෙනෙකු විය. මෙවර කවර වෙන් වන්නේ ඔවුන් සඳහායි.

කවරයේ කවි සංකල්පනාව
මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ
14(සෙව්) ශ්‍රීලපාහ


Printed by

softWave

107D, Havelock Road, Colombo 05.
Tel : 011 2502295, 2502134, 2502135
www.softwave.lk

# THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY QUARTERLY

**Colonel of The Regiment**

**Maj Gen** RMD Rathnayake RWP RSP USP ndu psc

**Centre Commandant**

**Col** KJ Jayaweera RSP

The White Hackle Editorial

**Editor in Chief**

Col KJ Jayaweera RSP

**Assistant Editors**

Maj AB Dodamwela SLLI

(ADJUTANT RHQ SLLI)

Maj TLM Chandrasekara RWP psc SLLI

(SO II (A) RHQ SLLI)

Maj KKIA Kumara SLLI

(Officer In Charge 'The White Hackle' RHQ SLLI)

**Chief Consultant**

Maj Gen RMD rathnayake RWP RSP USP ndu psc

**Honourary Consultants**

Maj Gen HV Athukorale VSV psc FBIM

(Rtd – Reg Force)

Brig AER Abeyesinghe KSV

(Rtd – Vol Force)

**Computer Type setting & Designed**

SGT Gunasiri SHIUK- 7SLLI

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry

Telephone - 0112855204
0112855356 - 60

Ext - 57656

Fax - 0112855204

E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com

Website - www.slli.lk & www.lightinfantry.lk


# Feedback

## අදහස්, උදහස් හා විවේචන
## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 73rd issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතු වැකිය

මව් කිරෙන් පෝෂනය කර තම දරුවන් කායිකව වැඩෙත්ම සෑම දෙමාපියකුට නිතැතින්ම තම ජයග්‍රහනයන් ආවර්ජනය කරමින් ජීවිතය පිළිබඳව සොම්නසින් බලනු ඇත. එහෙත් තම දරුවන්ගේ මනස ගුණ දහමින් පෝෂනය කිරීම ඉහත කී කරුනට වඩා අසීරු වනු ඇති බැව් ඔබට මොහොතකට පසක් වනුයේ ඉන් අනතුරුව ඔබ ලබන සමාජ අත් දැකීම් තුලිනි. අද පවතින තරඟකාරී විෂම සමාජයේ විවිධ අභියෝග හමුවේ වුවද නොසැලී දේශානුරාගයෙන් පරාර්ථකාමීත්වයෙන් තම දරුවන් පොෂනය කර දැයට ලබාදුන් මව්වරු පියවරු මෙම රෙජිමේන්තුව සතුවීම අපට ඉමහත් ආඩම්බරයකි.

යුද සෙබළෙකු වශයෙන් තම දිවිය දෙවැනි කොට යුද්ධයේදී සගයන්ගේ ජීවිත ආරක්ෂාව හෝ සිය බළකායේ සමස්ත අරමුණු ඉෂ්ට කිරීම සඳහා ස්වකැමැත්තෙන්ම ඉදිරිපත්වීමට විශිෂ්ට වූ හැකියාවන් සතුවීම සඳහා, ඔවුන් ලද යුද පුහුණුවට අමතරව තම මව්පිය ජානවල වූ සුවිශේෂී ගුණාංග ද විශේෂයෙන් දායක වනු ඇත. එමෙන්ම ඔවුන් ජීවත් වූ යහපත් සමාජයීය, අධ්‍යාපනික පසුබිම ද නිසැකවම ඒ සඳහා ඉවහල් වී ඇති බව කිව යුතුය.

ඔබගේ දරුවාට ශාරීරික පෝෂනය ලබාදෙන විට ඔබේ අවධානය ඔවුන්ගේ මානසික පෝෂනය වෙතද නිතර යොමු කරන්න. ඔවුන්ට උසස් දැනුම ලබාදිය යුතුය. ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කළ යුතුය. ආකල්ප වර්ධනය කළ යුතුය. සැබැවින්ම මේ තරඟකාරී සමාජය තුළ වුවද ඔවුන්ගේ ආකල්ප දේශානුරාගයෙන් පරමාර්ථකාමීත්වයෙන් හා සොබා දහමට ආදරය කරන්නෙක් ලෙස වර්ධනය කිරීම ඔබගේ පරම යුතුකම වනු ඇත.

The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

## සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

# IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ වීරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3451 | S/44071 | L/Cpl | Hemantha AMMD | 4 SLLI | Iranamadu | 23/01/2009 |
| 3452 | S/312709 | Sgt | Mahinda Rathna BW | 20 SLLI | Oddusudan | 24/01/2009 |
| 3453 | S/197014 | L/Cpl | Rajapakshe RMNUK | 4 SLLI | Iranamadu | 24/01/2009 |
| 3454 | S/199688 | L/Cpl | Saman Kumara EGS | 12 SLLI | Mullaitivu | 24/01/2009 |
| 3455 | S/315771 | Sgt | Ranasinghe RADDD | 20 SLLI | Oddusudan | 24/01/2009 |
| 3456 | S/17D00276 | Sgt | Darmathilaka GGL | 20 SLLI | Oddusudan | 24/01/2009 |
| 3457 | S/165433 | Cpl | Senavirathna SPDBS | 19 SLLI | Ampakamam | 25/01/2009 |
| 3458 | S/319938 | L/Cpl | Sampath GB | 4 SLLI | Wishwamadu | 25/01/2009 |
| 3459 | S/202002 | L/Cpl | Kumara DMCK | 7 SLLI | Wishwamadu | 25/01/2009 |
| 3460 | S/311874 | Cpl | Sisira Kmara PV | 19 SLLI | Olumadu | 25/01/2009 |
| 3461 | S/165468 | Cpl | Ghanarathna DGDW | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3462 | S/319825 | L/Cpl | Jayatissa GGJK | 19 SLLI | Olumadu | 25/01/2009 |
| 3463 | S/321283 | L/Cpl | Wijemanna WMW | 19 SLLI | Olumadu | 25/01/2009 |
| 3464 | S/301586 | Wo 11 | Athula Priyankara HW | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3465 | S/318690 | Sgt | Gunarathna PM | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3466 | S/15Q01576 | L/Cpl | Udaya Kumara WMW | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3467 | S/308900 | S/Sgt | Samarasinghe AN | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3468 | S/321636 | L/Cpl | Dewarahnayaka DMKN | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3469 | S/316884 | Sgt | Wanasinghe WMSP | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3470 | S/316529 | L/Cpl | Priyantha AMS | 19 SLLI | Oddusudan | 25/01/2009 |
| 3471 | S/320501 | L/Cpl | Wijitha Kumara SMS | 12 SLLI | Mullaitivu | 25/01/2009 |
| 3472 | S/321345 | L/Cpl | Thilakarathna WGMC | 15 SLLI | Mullaitivu | 26/01/2009 |
| 3473 | S/321380 | L/Cpl | Anurudda KA | 15 SLLI | Mullaitivu | 26/01/2009 |
| 3474 | S/203049 | L/Cpl | Munirathna JMK | 7 SLLI | Wishwamadu | 26/01/2009 |
| 3475 | S/319996 | Cpl | Namal DDS | 19 SLLI | Oddusudan | 26/01/2009 |
| 3476 | S/318677 | L/Cpl | Sirisena DGLM | 7 SLLI | Wishwamadu | 26/01/2009 |
| 3477 | S/196857 | L/Cpl | Sugath GA | 4 SLLI | Wishwamadu | 27/01/2009 |
| 3478 | S/170485 | L/Cpl | Maduranga HWC | 4 SLLI | Wishwamadu | 27/01/2009 |
| 3479 | S/169993 | L/Cpl | Jayaweera GR | 4 SLLI | Wishwamadu | 27/01/2009 |
| 3480 | S/320867 | L/Cpl | Madusanka KDS | 4 SLLI | Wishwamadu | 27/01/2009 |
| 3481 | O/313905 | Lt | AMAS Alahakon SLLI | 11 SLLI | Mullative | 27/01/2009 |
| 3482 | S/319016 | Cpl | Rajapakshe RDJ | 11 SLLI | Mullative | 27/01/2009 |
| 3483 | S/318338 | L/Cpl | Ruwan Kumara HVI | 11 SLLI | Mullative | 27/01/2009 |
| 3484 | S/202357 | L/Cpl | Upasena GGI | 11 SLLI | Mullative | 27/01/2009 |
| 3485 | S/202359 | L/Cpl | Rajapakshe AGMR | 11 SLLI | Mullative | 27/01/2009 |
| 3486 | S/320691 | Cpl | Sunil Shantha LH | 12 SLLI | Mullative | 27/01/2009 |
| 3487 | S/169088 | Cpl | Tharanga PS | 12 SLLI | Mullative | 27/01/2009 |
| 3488 | O/66903 | Lt | AAS Wijerathna SLLI | 20 SLLI | Iranamadu | 28/01/2009 |
| 3489 | S/23Q00508 | Cpl | Saman Kumara KD | 20 SLLI | Iranamadu | 28/01/2009 |
| 3490 | S/319464 | L/Cpl | Suresh A | 7 SLLI | Wishwamadu | 28/01/2009 |
| 3491 | S/194195 | L/Cpl | Lidapitiya LGSS | 19 SLLI | Ampakamam | 28/01/2009 |
| 3492 | S/320895 | L/Cpl | Sanjeewa PBP | 11 SLLI | Mullaitivu | 28/01/2009 |
| 3493 | S/315247 | L/Cpl | Nihal Nishantha HGD | 4 SLLI | Wishwamadu | 29/01/2009 |
| 3494 | S/319247 | L/Cpl | Pushpakumara EMR | 11 SLLI | Mullaitivu | 29/01/2009 |
| 3495 | S/320633 | L/Cpl | Samira WA | 8 SLLI | Ramanadanpuram | 29/01/2009 |
| 3496 | S/44216 | L/Cpl | Lelarathna MAN | 19 SLLI | Wishwamadu | 30/01/2009 |
| 3497 | S/310939 | L/Cpl | Jayawardena MR | 7 SLLI | Gen:Hosp:ANP | 31/01/2009 |
| 3498 | S/318092 | L/Cpl | Wijerathna JCP | 4 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3499 | S/311554 | S/Sgt | Chandanathilaka WAU | 4 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3500 | S/164284 | L/Cpl | Darmasiri AVKS | 4 SLLI | Wishwamadu | 31/01/2009 |

නව කොටසක් ලබන කලාපයේ

# 6 ශ්‍රීලපාහ මියගිය සහ අතුරුදහන් වූ රණවිරුවන් සැමරීම



පිරිත් සජ්ඣායනාව සිදු කිරීම සඳහා පූජනීය සංඝරත්නයට ආරාධනා කරමින්



පිරිත් සජ්ඣායනාව ශ්‍රවණය කරන රෙජිමේන්තු අධිපතිතුමා ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ නාමයෙන් ක්‍රියාන්විත රාජකාරීන් වල නියැලී සිටියදී මියගිය සහ අතුරුදහන් වූ රණවිරුවන් සිහිගන්වා ඒකකයේ 22 වන බළඇණි දිනට සමගාමීව පිංකම් මාලාවක් පැවැත්වීමට මෙවරද කටයුතු සුදානම් කරන ලදී. රටක් රැක ගන්නටත්, සමස්ත ජාතියම සනසන්නටත්, දැරූ උත්සහන් වලදී කුරිරු ත්‍රස්තවාදීන්ගේ රුදුරු වෙඩි ප්‍රහාරයන් හේතුවෙන් 1990.06.08 දින සිට 2009.05.20 වන දින දක්වා මෙම ඒකකයේ රාජකාරී කළ වීරෝදාර නිලධාරීන් 17 දෙනෙකු සහ සෙසුනිලයින් 447 දෙනෙකු අහිමි විය. නිදහස් නිවහල් දේශයක් ගොඩනැංවීමේ පරම පවිත්‍ර චේතනාවෙන් උතුරු නැගෙනහිර පළාත් වල පැවති භීෂනකාරි ත්‍රස්ත උවදුරට එරෙහිව මෙම ඒකකය සමග උරෙන් උර ගැටී ක්‍රියාන්විත රාජකාරි කරමින් සිටියදී දැයෙන් සමුගත්තද ඔවුන්ගේ නාමය සදා අනුස්මරණය කිරීම අපගේ යුතුකමක් වේ. එය මනාව තේරුම්ගත් අණදෙන නිලධාරි ප්‍රමුඛ සියලු දෙනාගේ ඇපකැපවීමෙන් 2012.06.16 වන දින රණවිරු පවුල්වල ඥාතීන් ඒකකය වෙත ගෙන්වා මෙම පිංකම් මාලාව සිදු කරන ලදී. ඒකකය වෙතින් සිදු කළ මෙම කෘතගුණ සැලකීමේ උත්සවය සඳහා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි මෙන්ම ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ද සහභාගි විය.

මේ සුවිශේෂී අවස්ථාවට රණවිරු දෙමාපියන්ට අමතරව ඒකකය ආරම්භයේ සිට මේ දක්වා ඒකකයේ සේවය කරන ලද නිලධාරීන් හා ජ්‍යොකොනොනින් විශාල සංඛ්‍යාවක් සහභාගි වී සිටියහ. එදින රාත්‍රිය පුරාවට පිරිත් සජ්ඣායනාවක් ද සිදු කරන ලදී.



සියනමකට වැඩි පූජනීය සංඝරත්නය වෙත දහවල් දානය පූජා කරමින්



මෙම සියලු පිංකම් වෙනුවෙන් සහභාගී වූ රණවිරු ඥාතීන්

2012.06.17 වන දින සිය නමකටත් වැඩි ගෞරවනීය සංඝයා වහන්සේලා වැඩම කරවා දහවල් දානය හා අටපිරිකර පූජා කරමින් ඒකකය නාමයෙනුත්, සමස්ත යුද හමුදාව නාමයෙනුත්, තුන් සිංහලය පර සතුරන්ගෙන් මුදවා නිදහස් නිවහල් රටක් අනාගත දූදරුවන්ට අත්කර දීමේ පරම පවිත්‍ර චේතනාවෙන් මියගිය සහ අතුරුදහන් වූ වීර සෙන්පතියන් හට පිං ප්‍රාර්ථනා කරන්නට දෙමාපිය ඥාති හිතමිතුරන් සමග යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති, 21, 53 සහ 58 සේනාංකාධිපතිවරු, 582 බළසේනාධිපති, ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ඒකකයේ පෙර සිටි අණදෙන නිලධාරීන්, ශ්‍රීලපාහ රෙජිමේන්තු සේනාවිධායක ඇතුලු ශ්‍රීලපාහ නිලධාරීන් මෙන්ම ශ්‍රීලපාහ ඒකකයන් හී රෙජිමේන්තු සැරයන් මේජර්වරුන්ද, ඒකකයේ සියලුම දෙනාද එක් වූයේ ඉතා සංවේගයෙනි. අපගේ මව්බිම වෙනුවෙනුවෙන් දිවිපිදූ සියලුම රණවිරුවන් හට නිවනින් සැනසේවායි යන්න අපගේ ඒකායන ප්‍රාර්ථනාව බවද සඳහන් කරන්නට මෙය අවස්ථාව කරගන්නෙමු.

මෙම උත්සව කටයුතු සාර්ථක අන්දමින් ඉටුකර ගන්නට කාර්යය බහුල රාජකාරීන් මධ්‍යයේ විවිධ අන්දමින් සහාය ලබාදුන් සියලු දෙනාටත්, සහභාගි වූ සියලුම දෙනාටමත් ඒකකයේ අණදෙන නිලධාරි නි/62440 මේජර් කේජ් පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ඇතුලු සියලු දෙනාගේ ප්‍රණාමය පුදකර සිටින්නෙමු.

**බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ**

# 2012 අන්තර් රෙජිමේන්තු ආධුනික මලල ක්‍රීඩා තරගාවලියේ ශූරතාවය ශ්‍රීලපාහට



ශ්‍රී ලංකා යුද හමුදා මලල ක්‍රීඩා කමිටුව විසින් 17 වන වරටත් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු ආධුනික මලල ක්‍රීඩා තරගාවලිය මෙවරත් 2012 ජුලි මස 09 සහ 10 යන දිනයන්හීදි ඉතා උත්කර්ෂවත් අන්දමින් දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.




යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි මෙන්ම ශ්‍රී ලංකා මලල ක්‍රිඩා සංගමයේ සභාපති, යුද හමුදා මලල ක්‍රීඩා සංගමයේ සභාපති, අප රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ යුද හමුදාව තුළින් නවක දක්ෂ මලල ක්‍රීඩක/ක්‍රිඩිකාවන් හදුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ළඟා කරවීමේ අරමුණින් පැවති තරඟ සඳහා සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 600 ක් පමණ සහභාගි වන ලදී.

මෙම තරගාවලියට ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙතින් ක්‍රීඩකයින් 33 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සහභාගි විය. පුරා දෙදිනක් තුළ පැවති ආධුනික මට්ටමේ තරඟයක් වුවද ඉතා තියුණු මුහුණුවරක් ගැනිණ. සියලුම රෙජිමේන්තු පරාජයට පත් කරමින් ශ්‍රීලපාහ ක්‍රීඩකයෝ තරඟාවලිය පුරාවටම දක්වන ලද දක්‍ෂතා හේතුවෙන්ම මෙවර සමස්ත ශූරතාවය අප රෙජිමේන්තුවට හිමි විය.





තරඟාවලියේ සමාප්ත උළෙල සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදා ඉංජිනේරු රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒජේඩබ්ලිව්සී ද සිල්වා ආර්ඩබ්ලිව්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී සහභාගි විය. ඊට අමතරව මෙම අවස්ථාවට සියලු රෙජිමේන්තුවන් හී ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා සම්භාවනිය අමුත්තන් රැසක් සහභාගි වූහ.

ඇත්තෙන්ම වසර 17 කට පසු ලද මෙම ජයග්‍රහණය අප රෙජිමේන්තුවට ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි. මෙම තරගාවලියේ ජයග්‍රහණයෙන් අනතුරුව සියලු ක්‍රීඩකයින් රෙජිමේන්තු සේනාවිධායක කර්නල් කේජේ ජයවීර ආර්එස්පී තුමන්ගේ පැසසුමට හා ඇගයීමට ලක්විය.



ප්‍රෞඩ ඉතිහාසයක් ඇති යුද හමුදාවේ මහ ගෙදරට මෙවැනි ජයග්‍රහන ලබාදීමට කැප වූ සියලුම දෙනාට රෙජිමේන්තු අධිපතිතුමා ඇතුලු සියලුම දෙනාගේ ගෞරවණිය ප්‍රශංසාව මෙන්ම තව තව ජයග්‍රහන වලින් ශ්‍රීලපාහ මාතාව බබලවන්න ඇවසි ශක්තිය හා ධෛර්යය නිරන්තරයෙන් ලැබේවා යි ඒකායන ප්‍රාර්ථනය වේ.

**ක්‍රිඩා අංශය රෙම ශ්‍රීලපාහ**






# 22 වන බළඇණි දිනය සමරන - 6 ශ්‍රීලපාහ



වර්ෂ 1990 ක් වූ ජූනි මස 08 වන දින 6වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව නමින් බිහිවිය. ඒකකය ආරම්භයත් සමගින් ක්‍රියාන්විත රාජකාරි සඳහා අම්පාර සහ මඩකලපුව ප්‍රදේශයන්හි වෙත අවතීර්ණ වී එතැන් පටන් අවසන් මානුෂිය මෙහෙයුම දක්වා උතුරු නැගෙ නහිර ප්‍රදේශයන් හී රාජකාරීන්වල නිරත විය.

රුදුරු ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයන්ගෙන් මේ භූමිතලය මුදවාගෙන ලාංකීය අහිංසක පුරවැසියන්ට නිදහසේ ජිවත්විය හැකි වටපිටාවක් ඇති කරලන්නට දරූ විශේෂිත වූ ක්‍රියාදාමයන් වලදී මෙම ඒකකයට අහිමිවූ විශිෂ්ට රණවිරුවන් සිහිගන්වා පිංපෙත් පැමිණවීමත්, ආබාධිත තත්ත්වයට පත්ව දූනට ප්‍රතිකාර ලබන විරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන්නටත් සුදානම් කළ පිංකම් මාළාවක් පැවැත්වීමට අණදෙන නිලධාරිගේ පූර්ණ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ කටයුතු කළහ

22වන බළඇණි දිනයට සමගාමීව 2012.05.28 වන දින සිට කණ්ඩායම් මට්ටමින් ක්‍රිඩා තරග මාළාවක් පවත්වන ලද අතර, අණදෙන නිලධාරිතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ තරග පවත්වා අවසානයේ ජයග්‍රහණය කළ කණ්ඩායම් වෙත ශූරතා කුසලනා සහ ත්‍යාග ලබාදීමට කටයුතු කරන ලදී. එහිදී ක්‍රිකට් හා වොලිබෝල් තරග'සී' කන්ඩායම ද, පාපන්දු තරගය 'පාලන' කණ්ඩායමද ශූරතාවයට හිමිකම් කීහ.

එදා මෙදාතුර 6 ශ්‍රීලපාහ ඒකකයට අණදුන් සෙන්පතියන් සිහිපත් කරමින් එතුමන්ලා රැගෙන ආ ජයග්‍රාහි ගමන් මග අතිශයින්ම සාර්ථකත්වයට පත්ව ඇති බව මේ වන විටත් පෙනෙන්නට ඇති අතර, එසේ එළිපෙහෙලි කරගෙන පැමිණි ගමන් මඟ තුළ තවදුරටත් ඒකකය කැඳවාගෙන යාමට ඒකකයේ නව අණදෙන නිලධාරි මේජර් කේජ් පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ හට පැවරී ඇති අතර, එතුමාගේ ඉදිරි රාජකාරි කටයුතු සාර්ථක අන්දමින් සිදු කරගන්නට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් 2012.06.08 වන දින උදෑසන සම්මාන මුරයක් මගින් උත්තමාචාර පිරිනැමීම ඒකක හටපිරිස් විසින් සිදු කළහ.



22 වන බළඇණි දිනය සැමරීම ආරම්භයෙන් අනතුරුව තවත් සුවිශේෂි සිදුවීමක් ඒකක භූමි පරිශ්‍රය තුළ සිදු විය. දිගු කාලසීමාවක් තිස්සේ ප්‍රමාද වෙමින් තිබූ සෙසුනිලයන්ගේ නිල උසස්කිරීම් නිවැරදි කරගනිමින් ඔවුන්ගේ යුද හමුදා ගමන් මගට නිසි දායනත්වය සලසා දෙමින් ඒකක අණදෙන නිලධාරිතුමන් විසින් සාමාන්‍ය සෙබළුන් 45 දෙනෙකු ලාන්ස් කෝප්‍රල් නිලය දක්වා ද, ලාන්ස් කෝප්‍රල් නිලයේ සිටි 131 දෙනෙකු කෝප්‍රල් නිලය දක්වා ද උසස්කිරීම්/පත්කිරීම් සිදුකිරිමටත් කටයුතු කරන ලදී. මෙහි වූ විශේෂත්වය නම් සම්මාන ඇඳුමින් සැරසුන උසස්වීම් ලබන්නන් නිල උසස් කිරීමේ පෙරෙට්ටුවක් පවත්වා අණදෙන නිලධාරිතුමන් අතින්ම සිදුවීමයි. නව නිලයකින් සරසාගත් ඔබ සැමට අපද මේ මොහොතේ සුබ ප්‍රාර්ථනා එක් කරනුයේ ඉතා සතුටිණි.



ඉන් අනතුරුව උදෑසන කාලයේ තේපැන් සංග්‍රහයක්ද පවත්වා පසුව සංගීත කණ්ඩායමේ සත්සර නාදරටාවන්ට අනුව සියලු නිලයන්ගේ සුහද හමුවක්ද පවත්වා අවසානයේ දිවා කාලයේදී සියලු නිලයන්යින්ගේ සහභාගිත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වන්නට ද කටයුතු කර තිබිණි.

මෙම සියලු කටයුතු වලින් පසු ඒකකයේ 22 වන බළඇණි දිනය නිමිත්තෙන් පැවති උත්සව කටයුතු නිමාවට පත් කෙරුණු අතර, ඒකකය ගමන් ගන්නා මාර්ගයේ 23 වන බළඇණි දිනය දක්වා පියමන් කරන්නට අණදෙන නිලධාරිතුමන් ඇතුලු නිලධාරින්ටත්, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සෙසුනිලයින්ටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්යය නිරන්තරයෙන්ම අත්පත් වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ**

# 62 වැනි සංවත්සරය සැමරූ 1 ශ්‍රීලපාහ





වසර 150 කට ආසන්න දිගු ඉතිහාසයක මතක සටහන් ලංකා පාබල හමුදාවට තිබෙන නමුත් 1950.05.12 වන දින අණදෙන නිලධාරිගේ අත්සනින් යුතු නියෝග 1 වන කොටස පළවීමෙන් ලක් දෙරණ මත ස්ථාපනය වු පළමු රණකාමී නිත්‍ය ඒකකය වූ 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව තම 62වන සංවත්සරය 2012.05.12 වන දින අති අභිමාණවත් ලෙස ඒකකය ස්ථාපිත පනාගොඩ කදවුරේදී සමරනු ලැබීය.

වසර 62 ක අභිමාණවත් ඉතිහාසයක් සපුරණ 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ පසු ගිය 62 ක ඉතිහාසය දෙස හැරි බැලිමේ දී අපලත් ජයග්‍රහණයන් අසීමිත වන අතර ඒ මත අපගේ ගෞරවනිය ඉතිහාසය ගොඩනැගි ඇත.

ත්‍රස්තවාදි ක්‍රියාවන් මැඩ පවත්වා මෑත ඉතිහාසයේ ලොවම මවිතයට පත් කරමින්, වසර 30 ට අසාන්න කාලයක් රටේ පැවැති ත්‍රස්තවාදී උවදුර තුරන් කළ මානුෂිය මෙහෙයුමේ විජයග්‍රහණය දක්වාම අප ඒකකය ඒ සඳහා



දැක්වු දායකත්වය අතිමහත් බැව් අවධාරනයෙන් යුතුව සදහන් කළ යුතුයි.

ත්‍රස්තවාදය රටෙන් මුලිනුපුටා දැමීමෙන් අනතුරුව, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි වලදී රට තුළ ඇති වු සිවිල් සාමාජීය ගැටළු වලදී ද එම ගැටළු ඉවසීමෙන් යුතුව නිරාකරණය කිරීම සඳහා විනය ගරුක හමුදාවක් ලෙස අප ඒකකය දක්වා ඇති දායකත්වය තුළින්ද කීර්තිමත් ඉතිහාසයක් රට තුළ ගොඩනගා ඇත.


බළඇණියේ කීර්ති නාමයත් ගෞරවයත් ආරක්ෂා කරමින් සම්ප්‍රදායන් හා සිරිත් විරිත් වලට මුල් තැන දෙමින් 62වන බළඇණි දින උත්සව කටයුතු ආගමික වතාවත් වලින් අරම්භ කළ අතර 2012.05.09 වන දින කතරගම කිරිවෙහෙර සහ මහදේවලය අභියස දී ඒකක ධජයන්ට සෙත් පැතීම හා ඒකකයේ මියගිය රණවිරුවන්ට හා තුවාල ලබා රෝහල්ගත කර සිටින රණවිරුවන්ට හා දැනට රාජකාරියේ නියතු සියලුම නිලයින්ට ද, ඔවුන්ගේ ඥාතින් හට ද, සෙත් පැතීම සිදු කරන ලදී. එමෙන්ම 2012.05.11 වන දින ඒකකය ස්ථානගත රෙම ශ්‍රීලපාහ පනාගොඩ කදවුරේ පිහිටි විහාරස්ථාන භූමිය තුළදී ද බෝධි පුජා පිංකමක් පවත්වන ලදී.

2012.05.12 වන දින ඒකකයේ 26 වන අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩබ්එස්කේ ලියනවඩුගේ ශ්‍රීලපාහ හට රෙජිමේන්තු සරඹ භූමියේ දී අභිමාණවත් වර්ණ ධජ සහිත පෙළපාළියක් පවත්වා උත්මාචාර පිරිනමන ලදී. එදින සියලු නිල භොජන සංග්‍රහයක් ද පවත්වන ලදී.

අනතුරුව 2012.05.13 වන දින සංගීත ප්‍රසංගයක් පවත්වා නිලධාරී/සෙසුනිලයින් සියලු දෙනා හට එකට විනෝද වීම සඳහා අණදෙන නිලධාරි විසින් අවස්ථාවක් ලබාදෙන ලදී. පසුව 2012.05.24 වන දින නිලධාරි නිවස්නයේ සාදයෙන් සහ 2012.05.26 වන දින බනි/සැර නිවස්නයේ සාදයෙන්ද බළඇණි දින උත්සව කටයුතු නිමාකරන ලදී.

මාතෘ භූමියේ ආරක්ෂාවටත් භෞමක අඛණ්ඩතාවය පවත්ගෙන යාම සඳහාත් 1 වන පාබල මැණියනි ඔබ තව තවත් ලක් දෙරණ මත වැජඹේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ**





# නොමියෙන පාබල විරුවෝ

කතෘ සටහන

පරම වීර විභූෂන පදක්කම් පිරි නැමීමේ උත්සවයක් ශ්‍රී ලංකාද්විපයෙන් රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් මුදාගෙන හරියටම වසර තුනක් සපිරෙන මොහොතේ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාලු මුවදොර පිටියේදී 2012 මැයි මස 19 වන දින සිදු කරණ ලදී. එම වීර පදක්කම් උත්සවයේ ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ වීර සොල්දාදුවන් තිදෙනෙකු සිටි අතර, ඔවුන්ගේ විස්තරයන් මෙසේ සටහන් තබමි.

**පරම වීර විභූෂන පදක්කම**





## සෙ/197405 ලාන්ස් කෝප්‍රල් රත්නායක ආර්එම්ඩීඑම්

වැලිමඩ දිසා රෝහලේ දී 1990 දුරුතු මස 29 වන දින රත්නායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතාට හා දිසානායක මුදියන්සේලාගේ යසවතී මහත්මියගේ බලාපොරොත්තු මල්ඵල ගන්වමින් පවුලේ දෙවැනි සිඟිත්තා ලෙසිනි ඩිල්ශාන් මදූෂංක රත්නායක පුතු මෙලොවට බිහි විය. එතැන් පටන් එම කැදැල්ල තවත් සුන්දර විය. සිඟිති අවධිය පසු කර 1995 වසරේදී බදුල්ල මස්පන්න මහා විද්‍යාලයෙන් සිප්සතර අකුරු කරවන්නට පාපොඩි තබා පියවර තැබුවේ ශ්‍රී ලංකා මාතාවගේ වීර පුතෙක් වෙනවා කියා සිතමින් වෙන්නට ඇති. විදුහල් මැණිගෙන් අධ්‍යාපනය ලබා මාතෘභූමියේ පැවති යුද වාතාවරණ හේතුවෙන් රැකියාව වශයෙන් නොව රුදුරු ත්‍රස්තයන්ගෙන් උපන්බිම බේරාගැනීම සඳහා 2008.05.17 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැදී මූලික පුහුණුව ලැබ 6වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත එක්විය.

නගර්කොවිල්, මුහමලේ, චලෙයි , පුදුමාතලන් හා මුලතිව් ප්‍රදේශයන් හී ඒකකය සමඟින් රාජකාරී කළ මධුසංක ඩිල්ෂාන් රත්නායක එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට එරහිව දියත් කළ අවසන් මානුෂිය මෙහෙයුමේදී නන්දිකඩාල් ආරක්ෂක වළල්ලට කඩා වැදුනු පළමු පෙළේ ගමන් ගත් පළමු සමාජිකයින් 04 දෙනාගෙන් එක් සාමාජිකයෙකු ලෙස මොහු ක්‍රියා කළේය. මෙහිදී හමුදාවන්ගේ ගමන ව්‍යාර්ථ කිරීමට ත්‍රස්තවාදින් විසින් මාරාගෙන මැරෙන බෝට්ටු කරුවන් යොදන ලදී. ලැබී තිබූ බාරදූර්ය කටයුත්ත තේරුම්ගත් මෙම වීර සෙබළා තම ජීවිතය ගැන නොතකා ඉදිරියට ඇදී ආ මරාගෙන මැරෙන බෝට්ටුකරුවන් වෙත දැඩි ප්‍රහාරයක් එල්ල කරමින් ඉදිරියටම ගොස් ත්‍රස්තවාදීන්ගේ ආරක්ෂක වළල්ල වෙත කඩා වදින ලදී. මෙහිදී මරාගෙන මැරෙන බෝම්බ කරුවෙකු විසින් පුපුරවා ගත් බෝම්බයකට ගොදුරුව මෙම විරුවා හට තම ජීවිතයට සමු දෙන්නට විය. තම ජීවිතය ගැන නොතකා පසුපසින් පැමිනි සහෝදර සෙබළුන්ගේ ජීවිත බේරා ගැනිමේ ඒකායන අරමුණින් අවසන් සුසුම්  වා තලයට මුදාහලේ ඉතිහාසය පුරා ලක්බිමේ සිටි විරුවන් ගොන්නට එක් වෙමිණි. මෙම රණවිරුවා තම සේවා කාලය තුළදී දේශ පුත්‍ර පදක්කමෙන් ද පිදුම් ලබා ඇත.

## සෙ/317077 කෝප්‍රල් අබේසිංහ ඒඑම්එම්පී



ඉතිහාසයේ වීරයන් බිහි වූ වෙල්ලස්ස ප්‍රදේශයේ අබේසිංහ මුදියන්සේලාගේ මදුශංක ප්‍රියනාත් අබේසිංහ නමින් 1982 ජනවාරි මස 30 වන දින මොණරාගල රෝහලේදී අබේසිංහ මුදියන්සේලාගේ බාලඅප්පුහාමි හා රත්නායක මුදියන්සේලාගේ පුංචිනෝනා දෙපලට දාව ඉපදී 1987 වසරේදී බුද්දම මහා විද්‍යාලය වෙත සුදු වතින් සැරසී පාසැල් අධ්‍යාපනය ලබන්නට විදු මාතාව වෙත ගිය මොහු අනාගතයේ රටේ ස්වාධිපත්‍යය වෙනුවෙන් සටන් කරුණු ලබන වීර පුතෙක් බැව් එවකට කාටවත් වැටහෙන්නට නැතුවා ඇති.

පාසැල් අධ්‍යාපනයෙන් පසු රට ජාතිය වෙනුවෙන් සේවය කිරීම සඳහා රැකියාව වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තෝරාගෙන 2002 නොවැම්බර් මස 30 වන දින ආධුනික සෙබළෙකු වශයෙන් යුද හමුදාවට එක් වී මූලික යුද පුහුණුවෙන් පසු ප්‍රෞඩ රෙජිමේන්තුවක් වන පාබල හමුදාවේ 8වන බළඇණිය වෙත ඇතුලත්ව උතුරු නැගෙනහිර ප්‍රදේශයන් හී රාජකාරි කර ඇත.

2008 ජූලි මස 25 වන දින අවසන් මානුෂීය මෙහෙයුමේ තවත් අධියරක් මුලතිව් තුනුක්කායි ප්‍රදේශයේ සිදු වෙමින් පැවතුණි. 8 ශ්‍රීලපාහ ඒකක හටපිරිස් ද එහි ඉදිරි ආරක්ෂක වළල්ල ඉදිරියට ගැනීමේ මෙහෙයුමේ නිරතව සිටියහ. එම හටපිරිස් කුඩා කණ්ඩායම් වශයෙන් ත්‍රස්තවාදී බළ ප්‍රදේශයන් අත්පත් කර ගනිමින් ඉදිරියට ගියහ. එක් කණ්ඩායමක් සමඟ ගිය ලාන්ස් කෝප්‍රල් අබේසිංහ කණ්ඩායම සමඟ සතුරු බංකර් පෙළකට ප්‍රහාරයක් එල්ලකර ත්‍රස්තවාදීන්ගේ බංකර් 07 ක් මුලුමනින්ම විනාශ කරන ලදී. සතුරු බල ප්‍රදේශයේ තවත් ඉදිරියට ගොස් ත්‍රස්තවාදී කණ්ඩායමක් සමඟ විනාඩි 15කට ආසන්න කාලයක් මුහුණට මුහුණලා සටන් කොට ත්‍රස්තවාදී ප්‍රහාරයන් අඩපන කිරීමට ලාන්ස් කෝප්‍රල් අබේසිංහ ආර්පීජී  අවියක් උපයෝගී කරගෙන සතුරු බංකරයක් වෙත ප්‍රහාරයක් එල්ල කර එහි සිටි

ත්‍රස්තවාදි තිදෙනෙකු ජීවිතක්ෂයට පත් කර ඇත. ඉන් නොනැවති ඉදිරියට ගිය මෙම හටපිරිස් තව තවත් සතුරු ඉලක්ක හඹා ගොස් ඇත. ත්‍රස්තවාදීන්ට හිසරදයක් වූ මෙම කණ්ඩායම කෙසේ හෝ නවතාලීමේ අරමුණින් කාලතුවක්කු ප්‍රහාරයන් නොනවත්වා එල්ල කර ඇත. එම සතුරු ප්‍රහාර හේතුවෙන් ලාන්ස් කෝප්‍රල් අබේසිංහ ඇතුළු වීර සෙබළුන් 05 දෙනෙකු තුවාල ලබා ඇත. තමාගේ තුවාල ගැන පසකලා තුවාල ලැබූ අනිකුත් සහෝදර සෙබළුන් උපක්‍රමශීලිව ප්‍රතිකාර සඳහා පසුපසට යැවීමට කටයුතු කළේ එඩිතර නායකයෙකුගේ ගුණාංග මතු කරමිණි. ත්‍රස්තවාදීන් වෙතින් එල්ල වූ කාලතුවක්කු ප්‍රහාරයන් තව තවත් දැඩි වී ඇති අතර, ඉන් පසු මෙම වීර කොනොනි ත්‍රස්තවාදීන් සිටින දිසාවන්ට ප්‍රති ප්‍රහාරයක් එල්ල කර සහෝදර සෙබළුන් පසුපසට ගැනීමට ආවරණය ලබාදී ඇත. ත්‍රස්තයින් ගේ ආක්‍රමණයෙන් මෙම වීර කොනොනි හට පසුපසට ඒමට නොහැකි ලෙසින් තුවාල ලබා ඇති අතර,පසුව අතුරුදහන් වී ඇත. ලක් ඉතිහාසයේ විරුවන් බිහි වූ බිමෙන් උපන් මෙම විරුවා තම සේවා කාලය තුළදී පූර්ණභූමි, උතුරු නැගෙනහිර හා දේශපුත්‍ර පදක්කම් ලබා ඇත.



**සෙ/319509 ලාකෝ දයානන්ද ටීජීඩීආර්**

පදවිය රජයේ රෝහලේදී 1988 ඔක්තෝබර් මස 06 වන දින දොළපිහිල්ලේ පහල තලගහ ගෙදර චන්ද්‍රා ඥාණගුරු මැණියන්ට හා තලහිටියා ගමරාළලාගේ දයානන්ද පියාණන්ට දාව දර්ශන රුවන් දයානන්ද මෙලොවට බිහි විය. ශ්‍රී ලංකාව බෙදා වෙන්කිරීමට උත්සහ දරණ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ බලපෑම් වලට ලක්වෙන මායිම් ගම්මාන ආසන්නයේ හැදී වැඩී පදවිය පලුගහ වංගුව විද්‍යාලයෙන් සිප්සතර හදාරා අවසානයේ හිසරදයක්ව පවතින ත්‍රස්තයින්ට එරහිව සටන් වැදීමට ශ්‍රී ලංකා යුද්ද හමුදාව තෝරාගෙන ඇත.

**ස්වකීය ජීවිතයටද, ආත්මාරක්ෂාවටද සිදුවිය හැකි උපද්‍රව ගැන නොතකා, සිය සගයන්ගේ ජීවිතාරක්ෂාව නොහොත් සිය බළකායේ කාර්යය අරමුණ මුදුන්පත් කර ගැනීම උදෙසා සක්‍රීය සේවා කාලය තුළදී ස්වෙච්ඡාවෙන්ම සතුරාට මුහුණපාමින් වික්‍රමාන්විත වූද, අභීත භාවය ප්‍රදර්ශනය කෙරෙන්නා වූද, ක්‍රියාවන්හී පෞද්ගලිකවම යෙදුනා වූද, මෙහි මින් මතු නිර්ණය කොට දක්වෙන රෙගුලාසි වල සඳහන් නියමයන් හා කොන්දේසි අනුව යෝග්‍යයයි යුද්ධ හමුදාපති, නාවික හමුදාපති හෝ ගුවන් හමුදාපති විසින් නිර්දේශ කරනු ලබන්නා වූද, ශ්‍රී ලංකා ජනරජයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි ස්ථිර හා ස්වෙච්ඡා බළසේනාවල නියුක්ත සෑම තාරාතිරකටම අයත් සියලුම පුද්ගලයින්ට, මෙම පළඳනාව ප්‍රදානය කළ යුත්තේය.**

**පළඳනාව පිරිනැමීම අතිගරු ජනාධිපතිතුමාගේ අත්සන සහ නිල මුද්‍රාව යටතේ කෙරෙන කැඳවීම් නියෝගයක් අනුව පැවැත්වෙන විශේෂ සම්මාන පිරිනැමීමේ උත්සවයකදී අතිගරු ජනාධිපතිතුමා විසින් පෞද්ගලිකවම සිදු කළ යුතුය.**

මූලික යුද පුහුණුවෙන් පසු ශ්‍රී ලංකා පාබල හමුදාවේ 8වන බළඇණිය වෙත ඇතුළත්ව උතුරු නැගෙනහිර ප්‍රදේශයන්වල රාජකාරි කළ දක්ෂ රණවිරුවෙකි. ලෝකෙටම හිසරදයක්ව පැවති රුදුරු ත්‍රස්තවාදීන් මෙරටින් තුරන් කිරීම සඳහා ආරම්භ කළ අවසන් මානුෂිය මෙහෙයුමේ යුදබිමේ ඉදිරියෙන් සිටි ලාන්ස් කෝප්‍රල් දයානන්ද 2008.09.15 වන දින කිලිනොච්චි අක්කරායන්කුලම් ප්‍රදේශයේ ත්‍රස්තවාදින්ගේ ප්‍රධාන සැපයුම් මාර්ගයක් වු කිලිනොච්චි - අක්කරයන්කුලම් මාර්ගය සමීපව රාජකාරී කරමින් සිටින ලදී. එදින 1වන විශේෂ බළකාය විසින් එම සැපයුම් මාර්ගය අත්පත් කර ගැනීම සඳහා ක්‍රියාන්විතයක් සිදු කර ඇති අතර, සිව් දෙනෙකුගේ කුඩා කණ්ඩායමක් ඔහු සමීපයේ රාජකාරී කර ඇත. එම කුඩා කණ්ඩායමක් වෙත ත්‍රස්තවාදින් විසින් එල්ල කරන ලද කාලතුවක්කු ප්‍රහාරයක් හේතුවෙන් විශේෂ බළකා සෙබළුන් තිදෙනෙකු තුවාල ලබා ඇත. ඉතිරි සෙබළා සමග එක්වී තුවාල ලැබු සෙබළුන් තිදෙනා පසුපසට ගැනීමට කටයුතු කර එම අවස්ථාවේදී ප්‍රහාර එල්ල කරමින් සිටි ත්‍රස්තවාදීන්ට ඔහු අත තිබු එම්පීඑම්ජී අවියෙන් ප්‍රහාරයක් එල්ල කොට ත්‍රස්තවාදීන් කිහිප දෙනෙකු ජීවිතක්ෂයට පත්කර තුවාල ලැබූ සහෝදර සෙබළුන් පසුපසට ගැනීමට ත්‍රස්තවාදීන් වෙත ආවරණ වෙඩි ප්‍රහාර තබමින් දරුණු පරාජයක් ත්‍රස්තවාදීන්ට ලබාදීමට මෙම කොනොනි හට හැකි විය. ත්‍රස්තවාදීන් මෙම කොනොනිගේ ප්‍රහාරයන් වලක්වාලීම සඳහා කාලතුවක්කු ප්‍රහාරයන් මෙන්ම මෝටාර් ප්‍රහාරයන් ප්‍රබල ලෙස එල්ල කර ඇත. මුහුණට මුහුණලා ඉතා දක්ෂ ලෙස සටන් කළ මෙම වීරෝදාර රණවිරුවා ත්‍රස්තවාදීන්ගේ කාලතුවක්කු ප්‍රහාරයන්ට ලක් වී ජීවිතක්ෂයට පත් වී ඇත. තම ජීවිතය ගැන නොතකා ඉතා දක්ෂ ලෙස ත්‍රස්තවාදීන්ට එරහිව සටන් වැද යුදබිමේ ඉතා විශාල මෙයක් ඉටු කර උපන් බිමට කළ යුතුකම් මනා ලෙස ඉටුකර අවසන් සුසුම් පොද වාතලට මුසු කළ ඔබ ඇත්තෙන්ම සැබෑ වීරයකි. මෙම විරුවාණන්ට දේශ පුත්‍ර පදක්කම හිමි ගන්වා ඇත.

**වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ**

# සුබ මොහොතින් නව තනතුරට පත් සියලුම නිලයින්ගේ



19 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62291 මේජර්
ටීඑන්කේ පෙරේරා ශ්‍රීලපාහ



4 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62721 මේජර්
ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ



20 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62548 මේජර්
අයිපී ජයසිංහ ශ්‍රීලපාහ



අංශභාර නිලධාරි
රණවිරු සුබසාධක අංශය
නි/62885 මේජර්
ඒආර්එම්ආර් වත්තෙතැන්න ශ්‍රීලපාහ



නිලධාරි අණදෙන
රෙජි පාලන කණ්ඩායම ශ්‍රීලපාහ
නි/63409 මේජර්
අයිකේජේ හර්ෂප්‍රිය ශ්‍රීලපාහ



12 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/63432 මේජර්
ආර්පී එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ



අංශභාර නිලධාරි ප්‍රකාශන අංශය
නි/5035 මේජර්
කේකේඅයිඒ කුමාර ශ්‍රීලපාහ



15 ශ්‍රීලපාහ විධායක අධිකාරි නි/67849
ලුතිතන් ඒපී ජයසිංහ ශ්‍රීලපාහ



24 ශ්‍රීලපාහ විධායක අධිකාරි නි/67811
ලුතිතන් ආර්එම්එස්ජ් කුමාර ශ්‍රීලපාහ

# වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු උණුසුම් සුබ පැතුම්...!



6 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62440 මේජර්
කේජ් පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී
ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ මානි I (ප්‍ර)
නි/63036 මේජර්
කේපීඑල් අමුණුපුරේ ආර්එස්පී ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ මානි II (ගිණුම්)
නි/63487 මේජර්
ඕඑන් මානගේ ආර්එස්පී ශ්‍රීලපාහ



18 (සේවා) ශ්‍රීලපාහ
දෙවන අණදෙන නිලධාරි නි/4880
මේජර් එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ



අංශභාර නිලධාරි තූර්ය වාදක අංශය
නි/4621 මේජර් එන්කේඩබ්ලිව්එච්ආර්
නානායක්කාර ශ්‍රීලපාහ



14 (සේවා) ශ්‍රීලපාහ
දෙවන අණදෙන නිලධාරි නි/5040
මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ



15 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි
නි/68560
2/ලුතිතන් ජේඑච්පීඑන්
ජයසිංහ ශ්‍රීලපාහ



24 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි
නි/67922 2/ලුතිතන්
ආර්අයිබීයූඑන් රත්නමලල
ශ්‍රීලපාහ



24 ශ්‍රීලපාහ රෙසැමේ
සෙ/302692 බනි 1 වීජීඑස් ශාන්ත



24 ශ්‍රීලපාහ රෙඋපාසැමේ
සෙ/302972
බනි 11 විජේරත්න වයිජීඑස්

# 12 ශ්‍රීලපාහ ''බියුගලර්ස් නෙස්ට්'' නිවාඩු නිකේතනය




12 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයන්ගේ කැපවීමෙන් හා දායකත්වයෙන් ඉදි කරනු ලැබූ 'බියුගලර්ස් නෙස්ට්' නිවාඩු නිකේතනය 2012 ජුලි මස 20 වන දින යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන් විසින් උදෑසන 1007 ට යෙදුණු සුබ මොහොතින් විවෘත කරන ලදී.

ප්‍රධාන ආරාධිත අමුත්තා වෙනුවෙන් කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීමද ඒකකය විසින් සිදු කළහ. මෙම සුවිශේෂි අවස්ථාව සඳහා ආසේමු (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයු සහ 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීආර්එච් ඩයස් පීඑස්සී අයිජී සහ, 591 බළසේනාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක් සහභාගි වූහ. කිරිඉබ්බන්වැව විහාරස්ථානයේ නායකහිමිපානන් විසින් පවත්වනු ලැබූ සෙත් පිරිත් සජ්ජායනය මධ්‍යයේ රෙජිමේන්තු ආඥාපති තුමන් විසින් පීත්තපටිය කපා සාම්ප්‍රදායික පොල්තෙල් පහන දල්වා උත්සව කටයුතු ආරම්භ කරන ලදි. පැමිණ සිටි සංඝයා වහන්සේලා දෙනම වෙත රෙජිමේන්තු අධිපතිතුමන් සහ ආසේමු (මු) ආඥාපති තුමන් අතින් අටපිරිකර පූජා කෙරුණි. ඉන් අනතුරුව රෙජිමේන්තු අධිපතිතුමන් ඇතුළු පැමිණ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් අභිනවයෙන් ඉදි කරනු ලැබූ '' බියුගලර්ස් නෙස්ට්'' නිවාඩු නිකේතනය නැරඹීම සිදු කරන ලදී. විවෘත කිරිමේ උත්සව කටයුතු අවසානයේ රෙජිමේන්තු අධිපතිතුමන් විසින් නිවාඩු නිකේතනය ඉදිරිපිට භූමියේ කොස් පැලයක් රෝපණය කරන ලද අතර, මෙම නිවාඩු නිකේතනය ඉදි කිරිමේ කටයුතු සිදු කළ සෙබළුන් කණ්ඩායමෙ සමඟ සමූහ ඡායාරූපයකටද පෙනී සිටීමට අමතක නොකළේය.

මෙදින රාත්‍රියේ ''බියුගලර්ස්'' නෙස්ට් නිවාඩු නිකේතනයේ ප්‍රථම රාත්‍රි භෝජන සංග්‍රහය පැවති අතර, ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූයේ අප රෙජිමේන්තු අධිපතිතුමන්ය. ආසේමු (මු) ආඥාපති, 59, 64, 68 සේනාංකාධිපතිවරුන්, 59 සේනාංකයේ බළසේනාධිපතිවරුන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක් මේ සදහා සහභාගි විය.

මෙම නිවාඩු නිකේතනය ඓතිහාසික යුද ජයග්‍රහනයක් ශ්‍රී ලංකා ඉතිහාසයේ වාර්තා කර එල්ටීටීඊ ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කරනු ලැබූ බිම්කඩට මායිම් වූ ''නන්දිකඩාල් කලපුවේ'' බටහිර දිසාවේ පිහිටා ඇත. භූගෝලීය වශයෙන් උතුරු අක්ෂාංශ 9.28333, නැගෙනහිර දේශාංශ 80.7667 අතර පිහිටා ඇති නන්දිකඩාල් කලපුව වර්ග කිලෝමිටර් 50 කට ආසන්න භූමි භාගයක් පුරා පැතිර ඇති නොගැඹුරු වෙරලාශ්‍රිත ජල මුලාශ්‍රයකි. මෙය පේරු ආරු ඇතුළු ඇල මාර්ග කිහිපයක එකතුවෙන් සෑදි ඇති අතර, නන්දිකඩාල් යන්නෙහි අර්ථය ''හක් බෙල්ලන් සහිත'' කලපුව යන්න වේ. මුලතිව් නගරය මෙම නන්දිකඩාල් කලපුවේ ගිණිකොණ දෙසින් පිහිටා ඇත. කලපුවේ පරිසර පද්ධතිය තුළ කඩොලාන සහ මුහුදු තෘණ වර්ග දැකිය හැකිය.



සාමාන්‍ය ජෛව විවිධත්වයක් ඇති මෙම කලපුව හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ මුහුදු ලිහිණියන්, කොකුන් විශේෂ, සංක්‍රමණික මුහුදු පක්ෂීන් විශේෂ හා කලපුව තුළ ඉස්සන් විශේෂ, මිරිදිය කකුළුවන් හා කරදිය මසුන් විශේෂ බහුලව දැකිය හැක.

කලපු ජලයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29.4 ක් වන අතර, පීඑච් අගය 8.43 කි. ජලය ලිටරයක් තුල දියවී ඇති සාමාන්‍ය ඔක්ෂිජන් ප්‍රමාණය මිලිග්‍රෑම් 5.5 ක් වන අතර, ජෛව විද්‍යාත්මකව මෙම තත්වයන් ජලජ ජීවීන් සඳහා ඉතාමත් හිතකර



වේ. මෙම කලපුව ආශ්‍රිතව වාසය කරන ධීවරයින් වසර පුරාම මත්ස්‍ය අස්වනු නෙලීමේ කාර්යයේ නිරත වනු දැකිය හැක.

යුදමය ජයග්‍රහනයෙන් පසුව ක්‍රමයෙන් ස්ථාපිතවූ සිවිල් පරිපාලනයත් සමග ඇතිවූ නිදහස් සාමකාමී වටපිටාව සියලු ශ්‍රීලාංකිකයින්ගේ සංචාර සදහා කැමැත්ත වැඩි වී ඇති අතර, එය විශේෂයෙන්ම අවසන් සටන් පැවති ප්‍රදේශ වෙත වැඩි ආකර්ෂණයක් පවතී.

ප්‍රදේශයේ පවතින දුෂ්කරතා හා යටිතල පහසුකම්හි නොදියුනු තත්ත්වය සංචාරකයන්ට දැඩි ලෙස බලපෑමක් පවතී. නිසිලෙස නවාතැන් ගැනීමේ පහසුකම් නොමැති තත්ත්වය හේතුවෙන් ඔවුන් විවිධ දුෂ්කරතා රැසකට මුහුණ පාන ලදී. තවද විශේෂයෙන්ම හමුදා සාමාජිකයින්ගේ ළඟම ඥාතීන් සහ හිතවතුන් හට හමුදා කඳවුරු තුළ නවාතැන් පහසුකම් ලබාදීම කළද ඒවාද අවම තත්ත්වයක පවතී.

එබැවින් ඉහත කරුණු සැලකිල්ලට ගනු ලැබූ එවකට 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒඩබ්එම්ඒඩබ්එන් රණවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් සියලු ඒකකයන්හි නිවාඩු නිකේතන ඉදිකරන ලෙස කළ දැනුම්දීම අනුව හා අප රෙජිමේන්තු අධිපති තුමන් විසින් සියළු ඒකක අණදෙන නිලධාරින් වෙත පැවැත්වූ පාලන සාකච්ඡාවන්හිදි මෙවැනි සංචාරක වටිනාකම් ඇති ස්ථානයන් දියුණු කර එමගින් ඒකකයන් වෙත ආදායම් ලබා ගන්නා ලෙස ඉදිරිපත් කළ සංකල්පයක් හේතුවෙන් මෙම ඒකකය වෙතින්ද ''බියුගලර්ස් නෙස්ට් නිකේතනය'' ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

ඒ සදහා ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒඑම්සීපී විජයරත්න ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් ඒකකයේ සියලු සාමාජිකයන් දැනුවත් කර මෙවැනි ව්‍යාපෘතියක් සිදු කරනු ලබන බවත්, ඒ සදහා කිසිදු සෙනියකුගේ මුදල් යොදා නොගන්නා බවත් පවසා සියලු දෙනාගේම සුබසාධනය වෙනුවෙන් මේ සඳහා අනුග්‍රාහකභවතුන් සොයාගෙන ඉදිරි කටයුතු කරනු ලබන බැව් දන්වා සිටින ලදී.

මෙම නිවාඩු නිකේතනය ඉදිකිරීම සඳහා විශේෂ කාර්යභාරයක් ඉටු කරනු ලැබූ ඒකක දෙවන අණදෙන නිලධාරි මේජර් ආර්පී එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ විසින් තම මිතුරකු මාර්ගයෙන් අදාල ගොඩනැගිලි සැලැස්ම සකස් කර අණදෙන නිලධාරි වෙතින් අදාල සැලසුම්හි වෙනස්කම් ඇවැසි ලෙස සකස් කරමින් මෙම කටයුත්ත සඳහා සාර්ථක ආරම්භයක් ලබාදෙන ලදී.

2011.09.30 දින සුබ මොහොතින් මේ සදහා ඒකක අණදෙන නිලධාරි විසින් මුල්ගල තැබූ අතර, මෙම භාරදූර කාර්ය සාර්ථක කර ගැනීම පිළිබඳව රැස්ව සිටි සෑම දෙනාම අවිශ්වාසයෙන් යුතුව සිටි බැව්ද මතක් කරනු වටී.

තම ආත්මවිශ්වාසය සහ අන්‍යයන්ගෙන් නිසි කාර්ය ලබාගැනීම කෙරෙහි නිවැරදි දැක්මකින් යුතුව ක්‍රියා කළ නිලධාරි පිරිසකගෙන් හෙබි 12 ශ්‍රීලපාහ ඒකකය මෙම අභියෝගය ජයගැනීම ආරම්භ කරනු ලැබුවේ ඒකකය වෙත ලැදි නිලධාරීන්ගේ කැපකිරීම සහ උත්සාහයන් මගින් ඇවැසි ද්‍රව්‍යමය සහ මූල්‍යමය පරිත්‍යාග සිය හිතවතුන්/ඥාතීන් මඟින් ලබා ගනිමිනි. තවද මේ සඳහා ප්‍රාදේශියව සොයාගත හැකි දෑ උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන මෙහි ඉදිකිරීම් සියල්ලම ඒකක සෙබළුන් විසින් සිදු කරනු ලැබූ අතර, එක් අවස්ථාවකදී පමණක් දෙවන අණදෙන නිලධාරිගේ ඥාතීන් කණ්ඩායමක් මඟින් ශ්‍රමදායකත්වය සපයා ඉදිකිරීම් වේගවත් කරනු ලැබීය. 2012.07.01 දින වන විට මෙහි ඉදිකිරීම් සියල්ල නිමකර අලංකාර කටයුතු සිදු කිරීමේදී විවිධ වූ කාර්යයන් සඳහා (පොලිෂ්/තීන්ත) වියදම් දැරීමට සිදුවූ අතර, ඒ සදහා අනුග්‍රාහකයන් සොයා ගැනීමට ගත් උත්සාහයන් ව්‍යර්ථ වීමෙන් පසු මෙතෙක් අප විසින් උත්සාහ කළ පරිදි ඒකක අරමුදල් වැය නොකර සිටීමට ගත් තැත ව්‍යර්ථ විය. එම හේතුවෙන් ඒකක අරමුදල් යම් ප්‍රමාණයක් (රුː150000.00 ක් පමණ) ඒ සඳහා යෙදවීමට සිදු විය. එයද ඉදිරියේදී ලැබෙන්නාවූ අනුග්‍රාහකයන් මඟින් සහ ආදායම් මඟින් ඒකක අරමුදල වෙත පියවීමට කටයුතු සූදානම් කරන ලදී.

මෙම නිවාඩු නිකේතනයේ ඉදිකිරීම් කටයුතු අතරතුර වරින් වර සොයා බලමින් අපගේ උනන්දුව වැඩි කල අප රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහ පැමිණ උපදෙස් ලබා දෙමින් අපව දිරිමත් කළ ආරක්ෂක සේනා ආඥාපති - මුලතිව් මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහ ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ කාරක සභික බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ද අප විසින් කෘතඥපූර්වකව සිහිපත් කරන්නෙමු.

**මූලස්ථානය 12 ශ්‍රීලපාහ**

**නිවාඩු නිකේතනයේ නවාතැන් පහසුකම් සඳහා ආහාර/තේ පැන් රහිතව එක් දිනක් (පැය 24 ක කාලයක්) සඳහා අයකරනු ලබන මිළ ගණන්**

**ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අයත් නිලධාරින්ගේ ළඟම ඥාතීන් සඳහා (නිලධාරියා සිටිය යුතුයි)**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 500.00 |
| සම්පූර්ණ නිවාඩු නිකේතනය | රුː | 2500.00 |

**ඒකකයට අයත් නිලධාරින්ගේ ඥාතීන් හා හිතවතුන් සඳහා**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 1000.00 |
| සම්පූර්ණ නිවාඩු නිකේතනය | රුː | 5000.00 |

**ඒකකයට අයත් සෙසුනිලයින්ගේ ළඟම ඥාතීන් සඳහා (සෙසුනිලයා සිටිය යුතුයි)**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 500.00 |
| සම්පූර්ණ නිවාඩු නිකේතනය | රුː | 2000.00 |

**ඒකකයට අයත් සෙසුනිලයින්ගේ ඥාතීන් හා හිතවතුන් සඳහා**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 1000.00 |
| සම්පූර්ණ නිවාඩු නිකේතනය | රුː | 5000.00 |

**වෙනත් ඒකක/රෙජිමේන්තු නිලධාරින් හා ඔවුන්ගේ ඥාතීන්/හිතවතුන් සඳහා**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 1250.00 |

**ඒකකයට අයත් සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 400.00 |
| සම්පූර්ණ නිවාඩු නිකේතනය | රුː | 2000.00 |

**වෙනත් සිවිල් අයවලුන් සඳහා**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 1500.00 |
| සම්පූර්ණ නිවාඩු නිකේතනය | රුː | 7500.00 |

**විදේශිකයන් සදහා**

| | | |
|---|---|---|
| එක් කාමරයක් | රුː | 2500.00 බැගින් |

**නිවාඩු නිකේතනය වෙන් කරවා ගත හැකි දුරකථන අංක**


0113 - 103547, 0113 - 154683

# මා දුටු සැටි

## සංස්කාරක සටහන

**ශ්‍රී ලංකා යුද හමුදාවේ පළමු වරට මුද්‍රණය කර පලකළ සඟරාව ලෙස සැලකෙන 1952 වසරේ ප්‍රකාශිත "The Ceylon Army Journal" නමැති ප්‍රකාශනයෙන් ලබාගන්නා ලද ලිපි 72 වන කලාපයේ සිට පලකරනු ඇත.**

වේලාව රාත්‍රි අට විය. ආරාධනා කරණු ලැබ සිටි අමුත්තන් සියල්ලම රෑ අහරට පැමිණියාහ. බීම වීදුරුවක් පානය කරමින් පිළිසඳර කථාවෙහි යෙදී සිටි මට කාලය ගෙවෙන අයුරු නොදනුණි. විනාඩි පහ, දහය, පහළොව වශයෙන් පැය බාගයක් ගතවිය. රාත්‍රි කෑම වේලාව දන්වන හොරණෑ හඬ ඇසිණි. ඉන්පසු සැවොම උන් තැන්වලින් නැගිට කෑම මේසේ තම තමන්ට නියමිත තැන් ගත්හ. අහර පිළිගැන්විණි. අහර කිස නිමවනවිට වේලාව රාත්‍රි දහයකුත් තිහක් විය. වාඩිවී සිටි එම දෙපැය හමාර තුළදී නොයෙක් දේ ගැන අපි කථා බහ කෙළෙමු. මගේ දකුණෙන් සිටි මේජර් මහතා විසින් ගතවූ මහා යුද්ධය ගැන යම් යම් කරුණු සවලපයක් කියන ලදී. එයින් එක් මාතෘකාවක් වූයේ ඔහු යුද සිරකරුවෙකුව කාලය ගෙවූ විලාසයයි. කෑම මේසයෙන් නැගිට හෝරා යන්ත්‍රය දෙස නෙත් යොමුකළ මා දුටුවේ රාත්‍රි එකොළහත් පසුවූ බවයි. විවේකාසනවල වාඩිවී උන් අප කීපදෙනෙක් අමුත්තන් ඉක්මනට නොයන වග නොඉවසිල්ලෙන් පුසුර පුසුරා උන්නෙමු. රාත්‍රී දොළහට පමණ අමුත්තන් සියල්ලම විසිර ගියෙන් මම මගේ කාමරය දෙසට පා නැගුවෙමි. කඩිමුඩියේ ඇඟලා තිබූ වස්ත්‍ර ලිහා දමා නිදන ඇඳුම් පොරවා යහනට


THE CEYLON ARMY JOURNAL
VOLUME I 1952 NUMBER I

විණිමි. කුසපුරා බුදින ලද අහරෙන් එයැ ගිලිමට උදව්වූ බීමෙන් ආධාරයෙන් දෝ, විනාඩි කිපයකින්ම නිදි දෙව්දුගේ ඇකයට වනිමි.

ස්වල්ප වේලාවෙක් යත්ම ලංකා පළමුවෙනි පාබල හමුදාවේ අණදෙන නිලධාරි තුමා වෙත පෙනී සිටින ලෙස දන්වා පනිවිඩයක් මට ලැබිණි. තවද මා පිටරට යැවීමට තෝරා තිබෙන වගද එම පුවත කීය. කිනම් රටකටද ,කුමන කටයුත්තකටද, මා නොදන සිටි හෙයින් , එම පුවත ලැබූ මොහොතේ සිට, මගේ සිත මා සමග තර්ක කරන්නට විය. නිවාඩු ඇත්තේ පැය විසිහතරකි. කාලය සීමාසහිත වූයෙන් ගෙදර ගියෙමි. ආරංචිය දෙමාපියන්ට කීවෙන් ඔවුහු එය ගැණ කණගාටු වූහ. නොයෙක් දේ කියා මා නතරකර ගැනීමට වෙර වැඩූහ. එහෙත් මා යුද හමුදාවට බැඳී සිටින්නේ රටටත්, ජාතියටත්, සේවය කිරීමට හෙයින්, කැඳවන මොහොතේ පසු බැසීම සිංහල රුධිරයෙන් ජනිතවූ මට ඉතාමත් කැලලක් බව වැටහුණි. දෙමාපියන්ගේ ඉල්ලීමට සවන් නොදුනිමි.

පෙරලා හට නිවස කරා පැමිණි මම අණදෙන නිලධාරි තුමාගේ කාර්යාලයට පා නැගුවෙමි. පුටුවක් දෙසට අත දිගු කෙළෙන් එහි වාඩිවූයෙමි.

"නුඹ තව පැය විසිහතරකින් මලයාවට හරිනවා. එයට තවත් අයෙක් සොයාගැනිම ඔබගේ මෙහෙය"යි. යනු නිලධාරියන්ගේ අණය විය.

"මට සැලයි නුඹ මැලයන් භාෂාව හොඳින් භාවිතා කරන බව, එය ඇත්තද" යනු එතුමාගේ දෙවැනි පැනයකි.

මා එය ඇත්ත බව ප්‍රකාශ කළායින් පසු හෙතෙම නැවතත් මෙලෙස කීය.

" පළමුවෙනි පාබල සේනාංකය කොමියුනිස්ට්වරුන් මර්දනය කරණු සඳහා තව මාස තුනකින් මලයාවට යවනු ලැබේ. නුඹද අහසින් ගොස් 'පැරෂුටයෙන්' බැස, අපේ පැමිණීමට සුදුසු යාත්‍රා පොළවල් සෑදීම සඳහා යෝග්‍ය බිම් තීරවල් ගැන විස්තර, සැලැසුම් අංශයට දනුම් දිය යුතුයි. කොමියුනිස්ට් බල පවත්වන පෙදෙස්ද දන්වනු" යි මට කීය.

ඔහු මට සුබ පැතීමෙන් පසු ඉතිරි සියල්ල ලබාගැනීමට සැලැසුම් අංශ නිලධාරියා වෙත යැමට කීය. සිතියම්ද රැගෙන ඔහු ළඟට ගිය මම ඉතිරි අවශ්‍ය දේ ලැබීමි. උවමනා සිතියම් පරීක්ෂාකර බැලූ මගේ දෙවෙනි පැනය විසඳීමට එළියට වටුයෙමි. මා සමග යායුතු කවුරුදැයි කල්පනා කරමින් සෙමෙන් සෙමෙන් ගිලන්හල දෙසට පියවර නැගෙත්ම මට මුණගැසුනේ අනෙකකු නොව මගේ දක්ෂ සාජෙන්ට් තැනය. ගමන ගැන කියනවාත් සමගම, ඔහුත් මා කැටුව ගෙනයන ලෙස ඉල්ලීය. රහස් ව්‍යාපාරවල යෙදවීමට උපන් අයෙකු වන එම සාජෙන්ට් මට ලැබීම ඉතා වාසනාවක් ලෙස සැලකීමි.

ගමන ඇරඹීමට දිනය පැමිණිනි. රාත්‍රි හතට පමණ අහස්යාත්‍රාපලට සෙන්දු වීමු. අප ගෙනයෑමට කුඩා යාත්‍රාවක් ලැස්තිව තිබුණි. එහි තුළට නැගුණු පසු දොර ඉබේම වැසිණි. බිම දිගේ ඉතා වේගයෙන් ඇදී ගොස් කෙමෙන් කෙමෙන් ගුවන් තලයට නගින බව මට දැනිණි. ස්වල්ප වේලාවකින් පසු අප යන්නේ ඉන්දියන් සාගරය උඩින් වග දෙවෙනි නාවිකයා කීවේය. රාත්‍රි නවයට පමණ මලයාවට උඩින් යන බව ඔහු මට දැන්වීය. ගමනේ කෙළවරට යාමට තව ඇත්තේ විනාඩි ස්වල්පයකි. සිවිල් ඇඳුම් ලාගෙන සිටි අපි දෙදෙනා පැරෂුටය බැගින් පිටේ බැඳගතිමු. තවම යාත්‍රාවේ රතු එළිය දල්විනි. පිටතට පැනීමට කාලය පැමිණි බවයි එය සඳහන් කෙළේ. මගේ සාජෙන්ට් පළමුවෙන් එළියට බට, දෙවනුව මමද පැන්නෙමි. දෛවයේ සැටි! ගුවන් ගතවූ සාජෙන්ට්ගේ පැරෂුටය නොඇරිණි. කඩාවැටෙන තරුවක් මෙන් ඉතා වේගවත් ලෙස ප්‍රපාතයට සාජෙන්ට් වැටුණේය. මගේ සියොළඟ ලොම් කෙළින් විය.

එලෙස සිටි මම වූ සිද්ධිය අමතක කිරීමට වෙර වැඩුවෙමි. බිමට බට විගසම පැරෂුටය වලලා පිටිය අයිනේ වූ වන ලැහැබ දෙසට ගමන් කෙළෙමි. එහි වාඩිවී ඉදිරියට කිරීමට ඇති දේ ගැන සිතිමි. නොයෙකුත් නාදයෙන් පිරුණු රාත්‍රියෙකි ඒ. නිලඹරයෙහි කිරිපිඩක් මෙන් බැබලෙන චන්ද්‍රයාගේ සුදෝ සුදු රශ්මියෙන් මිහිකත නැවිනි. අසල වූ වැවෙහි ජලය මත චන්ද්‍රයාගේ සෙවනැල්ල විය. හමන මඳ මඳ පවනින් තුරු කැල නැලවෙන්නටද වුනි. පුෂ්පයන්ගෙන් පැතිරෙන සුවඳින් පිරුණු මඳ පවනින් මගේ පෙනහළු පුරවා ගතිමි. කෑම සොයා එහේ මෙහේ පියාඹන වවුලන්ගේ නදින් කලබොලවූ අනිත් පක්ෂීහු ගසින් ගසට පියෑඹූහ.

වනය අද්දර පාළු ගෙයක් විය. මම එළිවෙනතුරු එහි නතරමට ඉටා ගතිමි. මා අතවූ හෝරා යන්ත්‍රයේ පස්වෙනි අංකය පෙනුනේද අඳුරෙනි. ගෙයින් පිටවීමටද වේලාව ළඟාවිනී. වනගත සෙබළුන් අටදෙනෙකු රාත්‍රි මුරය අවසන ආපසු යනවා මම දිටිමි. ගේ අසලින් ගමන්ගත් එංගලන්තයේ සාදන ලද හිස්

# මා දුටු සැටි

සිගරට් පෙට්ටියක් දැක එය අවුලා නායකයාට පෙන්වීය. සැකපිට ගෙය සෝදිසිකර බැලීමට ඔවුනට අන කෙලෙන් ක්ෂණයකින්ම ගෙය වට කරණ ලදී. මට එළියට යාමට ඉඩක් නොලැබිණි. මම බොරුවක් ගෙතීමි. කුමක්ද? අසනු ලබන පළමුවෙනි පැනය කුමක්දැයි සිතීමට මට පුළුවන්විය. සිතූ ලෙසටම සිදුවිය.

තා මෙතැන කුමක් කරන්නෙහිදැයි? යනු මගෙන් ඇසූ පලමු පැනයවී. මිත්‍රයෙකුගේ නිවසට යමින් සිටිමුත් රෑ බෝවුයෙන් මෙතැන නවාතැන් ගත් බව කීවෙමි. එය පිළිගත්තාක් මෙන් ඔළුව සෙලවූ නායකයා මා අතහැර යෑමට හැරිනි. නමුත් මා පසෙකවූ ගුවන් විදුලි යන්ත්‍රය දැක මාව සිරභාරයට ගත්තා ලදී. වාඩියට රැගෙන ගිය මා එහි ඇතුළු වූ විගසම රෞද්‍ර මුහුණින් යුත් සෙබළෙක් ඉදිරියට විත් නොයෙක් ප්‍රශ්න මගෙන් ඇසීය. මා උත්තර නොදුන් හෙයින් විෂඝෝර සර්පයෙකු මෙන් කිපී ඔහු මගේ කම්මුල හරහා පහර කීපයක්ද හෙලීය. යටි බඩටත් පහර කීපයක් වැදුණායින් පසු මම ආශ්වාස ප්‍රාශ්වාස කළේත් ඉතා අමාරුවෙනි. මුණෙන් ගලන රුධිරයෙන් තෙමී මා ඇඳසිටී වස්ත්‍ර රතු පලසක් මෙන් විය. අධික ලේ යෑමෙන් මම ක්ලාන්ත වීමි.

ප්‍රකෘති සිහිය ලැබුණු පසු මා ඉන්නේ සිර කූඩුවක බව වැටහුනි. උදේ අහරට ලැබුනේ කිවුල් රසැති දිය ටිකක් පමණය. දවල් එකොලහට පමණ කාමරයේ දොර ඇරිනි. අඩි පහකුත් අගල් හයක් පමණ උස්වූ, පලල් උරහිසැති තිස් හැවිරිදි පමණ වයස් වූ සෙබෙළක් ඇතුල්විය. නොයෙක් පරුෂ වචනයෙන් මට බැන වැදී මගේ මුව හරහට පාරවල් කීපයක් හෙලීය. මා ඇඳ සිටි වස්ත්‍රද ලිහා බලන ලදී. සතුරාට අසුවී බේරීමට නොහැකිවූ තැන සිය දිවි හානිකර ගැනීමට මා සූදානම්කර තුබූ වස ටික තැන්පත්කර තිබුණේ මාගේ මුද්ද ඇතුළතය. අතේ මාන්වූ ගැලවූ විගසම එය මුවෙහි ලා ගැනීමට මා තැත්කළ බව දුටු සෙබළෙක් ඉදිරියට පැන එය උදුරා ගතී. පසුව ඔවුහු අතින් සහ පයින් මට අනින්නට වුහ. එවිට මේ වද නොවිඳ මා දන්නා රහස් සියල්ල ඔවුනට දීමට පවා මට සිතිනි. එහෙත් මට පවරා තිබෙන්නේ ඉතාමත්ම විශේෂ කටයුත්තක් හෙයින් මා මැරුවත් එය නොදීමට ඉටා ගතිමි.

නැවතත් මෙලෙස ප්‍රශ්න කීපයක් මගෙන් අසන ලදී. ඒවාට බොරු උත්තර දුනිමි. ඔවුහු ඒවා සටහන් කරගත්හ.

"නොම්මරය"?
"ඊ/102584"
"තත්වය "?
"ලෙෆ්ටිනන්ට්"
"නම"?
"ඩින් ක්‍රිටිකාර"
"වැඩ කරණ අංශය"?
"මැලයන් ගුවන් හමුදාව"
"පදිංචිය"?
"එය උත්තර දීමට අවසර නැහැ"
"මෙහි නුඹේ කටයුත්ත "?

මම එයට උත්තර නුදුන්නෙමි. නැවතත් වරක් මට ගුටි වැදෙන්නට පටන් ගැනුණි. ඉන්පසු යලිත් මට මාන්වූ දමා කාමරයේ දොරද වසාදමා සැවොම එයින් පිටවුහ. වේදනාව ඉහිලිය නොහැකිව මට ඉබේම කෙඳිරි ගෑවිනි. සවස හතරට පමන කූඩුවේ දොර ඇර මා එළියට ඇද ගොස් ජලාශයක් ඉදිරියේ සිටවා නැවතත් ප්‍රශ්න කීපයක්ම ඇසීය. පෙර ලෙසම උත්තර දුනිමි. අන්තිම ප්‍රශ්නයට උත්තර නොදුන්නෙන් මගේ ගෙලෙන් අල්ලා දියෙහි හිස ඔබන ලදී. හුස්ම අල්ලා සිටිමුත් කොපමණ කලකටද? මගේ අත් පා පණනැතිවුයෙන් නැවත වරක් හිස දියෙහි එබුහ. ඉන්පසු කුමක්වීදැයි මම නොදන්නෙමි.

පසුදින උදෑසන කූඩුවෙන් එළියට ඇද දැමූ මට නැවතත් වරක් බැටදීමෙන් පසු නවතා තුබූ වෑන් රථයකට තල්ලුකර දමන ලදී. එහි තුළ මා වැනි අභාග්‍ය සම්පන්න බ්‍රිතාන්‍ය යුද හමුදාවේ නිලධාරින් හයදෙනෙක් සිටියෝය. රථය මගට බට. ඇහැ කොනකින් කළ ඉගයකින් පසු සැවෝම එක්ව මුරකරුට තලා උගේ පිස්තෝලේන්ම ඔහුට වෙඩි තබන ලදී. වෙඩි හඬ ඇසූ රියදුරා රථය නවතා විත් දොර අඩක් හරිනවිටම මා තැබූ වෙඩිල්ලෙන් හෙතෙමද විලිකුන් එලයක් ගසින් වැටෙන්නාක් මෙන් ඇද වැටුණි. එතැනින් බේරී ගොස් මම නියම රාජකාරියෙහි යෙදුණෙමි. දෙසතියකින් උවමනා කරුණු සියල්ල සපයාගෙන ලංකාවට පැමිණියෙමි.

හෝරා යන්ත්‍රය හය බව සදහන් කෙළෙන් මම පිබිදියෙමි. තවම මම යහනෙහි බව වැටහුණි. මේ මා දුටු සැටි. එය සීනයකි.

**2/ලුතිතන් සු.බ මියනදෙනිය - ලංකා පාබල හමුදාව**

# වෙඩි නොවදින කබාය

මහ මඟ වෙළඳාමෙන් දිවි          ගෙවන
දුප්පත් කබා වෙළඳෙක් කපටිව          වසන
ඔහු සිතූ කාල සටනෙ රැඳවුන          ලෙසින
පය එස වුයේ යන්නට          ගමන

ගියත් වෙළදාම නිසරුවු බව          දැනුනේ
බඩගින්නෙන් පවසයෙන් සියොගත          දැවුනේ
සොද උපාමාරුවක් සිත විත්          එදිනේ
ගොසින් සෙබළෙකුගෙ නිවසක් වෙත          රැදුනේ

වෙළෙන්ඳා :-
මෙය වැදගත් දෙයකි කෙනෙකුට රණ          කාමී
ඇඟලා සටන් කළහැකි වැද යුද          බූමී
සොද ගුණ නුවණ එඩිතර පින්වත්          සාමී
වෙඩි නොවදින කබායක් මම ගෙන          ආමී

සෙබළා :-
පුදුමයි ඔබගෙ කියමන මට සැක ම          හිතයි
නොදනම් එය හිත වැඩ පිණිසම          පවතියි
එහෙයින් මම අසන්නට පැණයක්          කැමතියි
කොහොමද ? මම දන්නෙ එය වෙඩි නොම          වදිතියි

වෙළෙන්ඳා :-
මබස් විමසලා මෙය ඔබ ගන්න          හොඳා
බොරුවක් කිසිත් වංචාවක් නැතෙයි          සුදා
වැඩි ගණනකුත් නොම කීවෙමී ඔබට          හදා
බලනු මැනවි මෙය ඇඟලා යුදට          වැඳා

සෙබළා :-
ඕනෑ මගේ සිත ඇති සැක හැර          ගන්න
ඔබම රැගෙන මෙය ඇඟලා ගෙන          ඉන්න
තබනෙමි වෙඩිල්ලක් ඔබහට මම          ඔන්න
පොඩියක් ඔහොම වෙළදානෙනි, නව          තින්න

කියමින් සෙබළ තෙම ගෙතුළට පා          නැඟුවා
පතරොන් රැගෙන මැගසිනයට ලා          එබුවා
සකසා රයිපලය දොරකඩ විත්          බැලුවා
වෙළඳත් කබායක් එහි නැති බව          දුටුවා

**සෙ/71091 ලාන්ස් කෝප්‍රල් ජයවර්ධන පීජීජී විසිනි.**
**භෞමික හමුදා ආධුනික අභ්‍යාශයාතනය.**
**දියතලාව.**

# රෙජිමේන්තු අධිපතිතුමාට හා රෙම ශ්‍රීලපාහට රණවිරු බිරිඳකගෙන් තුති ...

නො 225 /19/1
තුමුල,
රාජාවත්ත,
කඩුගන්නාව
2012 ජනි 03 දින

රෙපිමේන්තු අධිපති තුමා,
ශ්‍රී ලංකා පාබල හමුදාව

<u>ස්තුතිය ප්‍රකාශ කිරීම - හෘද රෝග සැත්කම සිදු කිරීම නිලධාරි</u>

රෙපිමේන්තු අධිපති තුමනි,

I. මාගේ ස්වාමි පුරුෂයා වන හිටපු 9 ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩබ්.ජී.පී සිසිර කුමාර ආර්එස්පී ශ්‍රීලපහ හට හදිසියේ ඇතිවූ දරුණු හෘද රෝග සැත්කමක් වෙනුවෙන් විශේෂඥ වෛද්‍යවරුන්ගේ දැනුම් දීම මත ලංකා(පුද්) රෝහල වෙතින් කඩිනමින් බයිපාස් සැත්කමක් සිදුකර ගන්නා ලද අතර මේ වනවිටත් ඔහු සුවය ලබමින් සිටී.

II. යුද හමුදා රෝහලේ අදාල බයිපාස් සැත්කම සිදුකර ගැනීමට අදාල පහසුකම් නොමැති වීම හේතුවෙන් හා කොළඹ ජාතික රෝහලේ ද පොරොන්තු ලේඛනයේ දිගු කලක් රැඳී සිටීමට හේතුවීම තුලින් විශේෂඥ වෛද්‍යවරුන්ගේ මතය වුයේ රෝගයේ දැඩි අවධානම් තත්වය මත පෞද්ගලික රෝහලකදී හෝ මෙම ශල්‍යකර්මය කඩිනමින්ම සිදු කර ගත යුතු බවය. ඒ අනුව එම කෙටි කාල වකවානුව අනුව මුදල් සපයා ගැනීමේ අපහසුතාවයක් පැවති අතරම එහිදී මාගේ ස්වාමි පුරුෂයා පැවසුවේ කිසි දේකට බිය නොවන ලෙසත් මුදල් සපයා ගැනීමේ ප්‍රශ්නයක් නම් අප රෙපිමේන්තුව මගින් යම් ණය මුදලක් ලබා ගනිමු යන්නය. ඒ කී අතරයෙන්ම ඔබ රෙපිමින්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් මාගේ ස්වාමි පුරුෂයාගේ රෝගී තත්වය හා මුදල් සපයා ගැනීමේ ගැටළු කාරී තත්වය ඔබ තුමා වෙත දුරකථනයෙන් සල කර සිටි වහාම ඔබ විසින් එම අවස්ථාවේම පවසා ඇත්තේ ඉල්ලන මුදල කොපමණවුවත් එය මාගේ ස්වාමිපුරුෂයා වෙත ලබා දී ඉක්මණින් ශල්‍යකර්මය සිදුකරගන්නා ලෙසටය. ඒ අනුව පැය 24ක් යෑමට මත්තෙන් අප වෙත රුපියල් ලක්ෂ 2ක මුදලක් ලැබු බැවිද ඉතාමත් කෘතඥ පූර්වකව ඔබ මෙත දැනුම් දෙමි. රෙපිමේන්තු අධිපතිතුමනි, එම මුදල ලද වහාම මාගේ ස්වාමි පුරුෂයා හා මා පෙලනු දැඩි මානසික අපහසුතාවයට අස්වැසිල්ලක් වූ අතරම ඉතාමත්ම යහපත් මනසකින් යුක්තව අප ශල්‍යකර්මය සිදු කරගත් බව කාරුණිකව පෙන්වා දෙමි.

III. රෙපිමේන්තු අධිපතිතුමනි, මා ද රජයේ රෝහලක වසර 22ක් හෙදි නිලධාරියෙක් වශයෙන් සේවය කරන අතර මාගේ ස්වාමි පුරුෂයා විවාහ කරගත් 1998 වසරේ සිට මේ දක්වාම මා විසින් ද මාගේ ස්වාමි පුරුෂයාගේ දැනුම් දීම මත මා හට කල හැකි උපරිම ආකාරයෙන් යුද හමුදා නිලධාරින්ට හා සෙබලන්ගේ පවුල්වල උදව්ය වෙත ප්‍රමුඛත්වය මත පේරාදෙනිය රජයේ රෝහල වෙතින් ඇවසි වෛද්‍ය උදව් උපකාර අවශ්‍යතා ඉෂ්ඨකර දෙන බැවිද කාරුණිකව පෙන්වා දෙන අතරම ඔබ වෙතින් කරන ලද මෙකී පුන්‍ය කටයුත්ත වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය ඔබ වෙතත් ඔබ රෙපිමේන්තු මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙතත් පුද කිරීම වෙනුවෙන් මෙකී ලියුම ඔබ වෙත යොමු කරනු බැව් කාරුණිකව පෙන්වා දෙන අතර. ඔබ හට ඔබගේ ඉදිරි [illegible] ඉෂ්ඨ වී තව දුරටත් ශ්‍රීලපහ රෙපිමේන්තුව වෙතත් සමස්ථ යුද [illegible] හමුදාව වෙතත් සමස්ථ ශ්‍රී ලංකාවටත් සේවයක් කිරීමට ශ්‍රී දළදා සමිදු පිහිටෙන් ශක්තිය ධෛර්‍ය වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ස්තුතියි.

(අත්සන)

එම් අශෝකා වික්‍රමසිංහ,
ලුතින් කර්නල් WGP සිසිර කුමාර ආර්එස්පී ගේ බිරිඳ

පිටපත් :- මධ්‍යස්ථාන සේනාවිධායක
කර්නල් සම්බන්ධීකරන (සෙවි) නිලධාරි
වයිට් හැංකල් අංශය

# 15 ශ්‍රීලපාහ පොසොන් අසිරිය

පොසොන් සිසිලසින් මුලු රටම නැහැවෙද්දී යුද හමුදාව තුළ ඒ නිමිත්තෙන් වැඩසටහන් බොහොමයක් සංවිධානය කර තිබුණි. මහින්දාගමනයේ ආශිංසනය රැගත් බුදු දහම අප ලක් මැණියන්ට දායාද වූ පින්බර දිනය සැමරීමට මෙවරද 22 වන සේනාංකයට අයත් බළඇණි විසින් මහත් පරිශ්‍රමයක් දරා තිබුණි.

ඒ අනුව 15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් 22 සේනාංක මූලස්ථානය යටතේ ත්‍රිකුණාමලය අනුරාධපුර මංසන්දිය අභියස ස්ථාපිත පොසොන් කලාපය පැවති භූමියේ අනුබුදු මිහිඳු හිමියන් බුදුදහම රැගෙන මිහින්තලාවට වැඩම කර දෙවන පැතිස්ස මහ රජතුමන්ට දම් දෙසු අවස්ථාව පිළිබිඹුවන මහින්දාගමනයේ ආකෘතියක් නිර්මාණය කර තිබීම කාගේත් පැසසුමට ලක්විය. සාම්ප්‍රදායික පොසොන් පහන් කුඩු සංකල්පයෙන් මිදී මෙවන්වූ නව නිර්මාණයක් ඉදිරිපත් කිරීමට හැකිවීම අණදෙන නිලධාරිගේ නිවැරදි මග පෙන්වීමත් අනෙකුත් නිලධාරින්ගේ හා සියලුම සෙසුනිලයින්ගේ එකමුතුභාවයත් මනා ලෙස විදහාපෑමකි.

බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ



# ලේ බිඳක් පරිත්‍යාග කර දකුණත් නැගෙනහිරත් යාකළ - 15 ශ්‍රීලපාහ

යුද්ධය නිමාවී සාමයේ අරුණලු විකසිතවී ඇති අවධියක සීග්‍රයෙන් දියුණු වෙමින් සංවර්ධනයේ මංපෙත් විවර වී ඇති නැගෙනහිර පළාතේ කින්නියා හා තඹලගමුව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල ජීවත්වන සිංහල, දමිළ සහ මුස්ලිම් ජාතීන්ගේ ආරක්ෂාව තහවුරු කරන අතරතුර 15 ශ්‍රීලපාහ ඒකකය බළ ප්‍රදේශයේ සිවිල් ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සංවර්ධන කටයුතු හා සිවිල් සම්බන්ධිකරණ කටයුතු විශේෂ තැනක් ගන්නේය.



ඒ අනුව සම්බුදු තෙමඟුල නිමිත්තෙන් අණදෙන නිලධාරිගේ මග පෙන්වීම යටතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ජාතික ලේ දන්දීමේ සේවය හා එක්ව කින්නියා ත්‍රී/අබ්දුල් මජීඩ් විද්‍යාලයේදී 2012 මැයි මස 13 දින නැගෙනහිර පළාතේ ජනතාව වෙනුවෙන් ලේ බිඳක් පරිත්‍යාග කර මහගු පිංකමකට දායක වීමේ භාග්‍ය 15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට උදාවිය.



ජාතීන් එක්කර එක් ශ්‍රී ලාංකීය ජාතියක් බිහි කිරීමට ලේ බිඳක් පරිත්‍යාග කර ජීවිතයක් බේරා ගැනීමට ගත් මෙම ක්‍රියාමාර්ගය සඳහා 15 ශ්‍රීලපාහ ඒකකයේ නිලධාරි හා සෙසුනිලයින්ට අමතරව 224 බසේමු, 5 ශ්‍රීලකාහ ඒකකයේ නිලධාරි මෙන්ම සෙසුනිලයින්ද දායක විය.

බහුල වශයෙන් මුස්ලිම් හා දමිළ ජන කොටස් ජීවත් වන කින්නියා වැනි ප්‍රදේශයක යුද හමුදා සාමාජිකයින් විසින් ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුළින් සිවිල් ජනයා හා යුද හමුදාව අතර, ගොඩනැගී ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කරන්නක් විය. මෙම සත්කාරය අන්‍ය ආගමික නායකයින්ගේ ද, පැසසුමටද ලක්විය.

**බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ**

## මගේ අම්මා

| | | | |
|---|---|---|---|
| ලොවටම අඳුරදී හිරු සිතිජයේ | හැංගී | අවුරුදු ගෙවුනා නොදැනිම | අම්මේ |
| ආ හැටි එළිය දී සඳ සාමිය | හැංගී | අනාගතේ සියළුම බලාපොරොත්තු මා | අම්මේ |
| කඳුළැල් තබාගෙන නිති ඇස් යට | හැංගී | පෙරමග බලා සිටියදි ඔබ | අම්මේ |
| මේ පද ගොතන මා | හැංගී | ඒ ලෙසින්ම ඉටු කරන්නම් | අම්මේ |
| ආදර සිනාවක් නිතරම මුව | රන්දා | නුඹ දුක් විදින්නේ අප සතුටින් | තබන්නට |
| දිවි ගැට ගසන්නට නුඹ දුක් | වින්දා | නුඹ කැපවුනා අප ලොව මල් | පුදන්නට |
| ඒ දුක් අනේ අපහට නුඹ ගෙන | දුන්නා | ආදර නුඹේ සිහිනය ඉටු | කරන්නට |
| බුදු රුව මැවුණි නුඹේ රුව සිත් | ගත්දා | කැපවෙන්නම් මා අනාගතේ ජය | ගන්නට |

**කෝප්‍රල් කරුණාසේන එම්ඩීඑස්කේ 'සී' කණ්ඩායම 8 ශ්‍රීලපාහ**

# 4 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරි




4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලැබූ නි/62199 ලුතිතන් කර්නල් එම්සීඑස්කේ සේනාරත්න ආර්එස්පී ශ්‍රීලපාහ සාම සාධක රාජකාරි සඳහා යාමට මෙම ඒකකයෙන් නික්ම යන ලදී. 2012.06.14 දිනය ඒකකයට සුවිශේෂි දිනයක් විය. ඒ ඒකකයේ 16 වන අණදෙන නිලධාරි වශයෙන් නි/62721 මේජර් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ අණදෙන නිලධාරි තනතුරෙහි රාජකාරී භාර ගැනීම හේතුවෙනි. දෙවන අණදෙන නිලධාරි විසින් නව අණදෙන නිලධාරි පිළිගැනීමෙන් පසු කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. ඉන් අනතුරුව දෙවන අණදෙන නිලධාරි විසින් ඒකකයේ නිලධාරින් හා ජ්‍යෙකොනොනින් හඳුන්වාදීමෙන් පසු චිරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දල්වා පෙරවරු 0615 පැයට මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මැද නව තනතුරෙහි රාජකාරි භාරගන්නා ලදී.

සිය තණතුරේ වැඩ භාරගැනීමෙන් අනතුරුව ඒකක බුදු මැදුර වෙත ගොස් මල්පහන් පූජා කොට බෝධිය නැහැවීමෙන් අනතුරුව ඒකකය වෙත වැඩම කරවා සිටි මහා සංඝරත්නය වෙත හීල් දානය පිළිගන්වන ලදී. ඉන් අනතුරුව අණදෙන නිලධාරි විසින් ඒකකයේ සියලුම දෙනා අමතමින් හරවත් දේශණයක් සිදු කරන ලදී. වසර 25 ක ඉතිහාසයක් පුරාවට ඒකකය වෙත පැමිණි අභියෝග බාධක ජයගනිමින් කුරිරු ත්‍රස්තවාදීන්ගෙන් රට බේර ගැනීමට



දායකත්වය ලබා දෙමින් ඒකකය මෙතෙක් පැමිණි සාර්ථක ගමන් මගට උරදුන් ඒකකයේ හිටපු අණදෙන නිලධාරිවරුන් අනෙකුත් සියලුම නිලධාරින් හා සෙසුනිලයින් හට හදපිරි ස්තූතිය පුද කරක ලදී. එමෙන්ම සටන් බිමේදි මියගිය රණවිරුවන් හට නිවන්සුව ප්‍රාර්ථනා කළ අතර, තුවාල ලබා දූනට ප්‍රතිකාර ලබන සියලුම විරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන ලදී. දේශණයෙන් පසු ඒකකයේ නිලධාරි හා සෙසුනිලයින් විසින් සංවිධානය කරන ලද තේ පැන් සංග්‍රහයටද අණදෙන නිලධාරි සහභාගී විය. නව අණදෙන නිලධාරි හට තව දුරටත් ඒකකය අභිමානවත් ලෙස ඉදිරියට ගෙන යාමට අවැසි ශක්තිය හා ධෛර්යය මෙන්ම ත්‍රිවිධ රත්නයෙත් සියලු දෙවි දේවතාවුන්ගෙත් පිහිට ආරක්ෂාව නොඅඩුව ලැබේවායි! ඒකකයේ සියලුම අයවලුන් විසින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**

## සුදු නංගි



සංසාරයේ පැතුමත් ලෙසදෝ
ඔබ මා සොයා මගේ ජීවිතේ
මගේ ලොවට මිණි පහන ඔබයි
සුදු නංගියේ
මහ සයුර තරම් ඔබ වටී

මගේ සුර දූතිය ඔබයි සැමදා
සදාකල් වඩිනු මැන ඔබ මාගේ වන්නට
පැතුමක් පතන්නෙමි මගේ ලෝකේ
එළිය කරන්නට මගෙ සුදු නංගි
මගේම වන්නට කියා

කෝප්‍රල් වනසිංහ ඩබ්ලිව්එම්පීබී - අණ සහ පාලන කණ්ඩායම 1 ශ්‍රිලපාහ

# දුටුගැමුණු එළාර ඉතිහාස පුවත පිළිබිඹුවන 6 ශ්‍රීලපාහ පිවිසුම් දොරටුව



ඉදිකිරීමට යෝජිත ප්‍රධාන දොරටුව



ප්‍රධාන දොරටුව ඉදිකිරීම සඳහා මුල්ගල තබමින්

ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපතිතුමාගේ සංකල්පයකට අනුව මූලස්ථානය 6 ශ්‍රීලපාහ මහකනදරාව කඳවුරේ ඉදිවන දුටුගැමුණු එළාර ඉතිහාස පුවත පිළිබිඹු වන ප්‍රධාන දොරටුව සඳහා 53 හා 58 වන සේනාංක සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී තුමන් අතින් මුල්ගල තබන්නට යෙදුණි. මෙමගින් පුරාණ සිංහල රජතුමන්ලාගේ බලපරාක්‍රමයෙන් සහ අදහාගත නොහැකි අන්දමේ සංවර්ධන මෙන්ම බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීමෙහිලා දක්වා ඇති ක්‍රියාදාමයන්ගෙන් පරිපූර්ණ වූ ඓතිහාසික රජරට ප්‍රදේශයටම ආවේණික වූ ප්‍රෞඪත්වයෙන් හෙබි යුද හමුදා කඳවුරක් බවට 6 ශ්‍රීලපාහ නවාතැන්පල පත්වේවායි යන්න අපගේ ඒකායන ප්‍රාර්ථනයයි.

බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ

## මවකගේ සෙනෙහස

පියෙකු නොමැති ලොවහිරු සදු වුයේ
ඔබේ සෙනෙහසයි මගේ අම්මේ
මෙතේ බුදුන් මෙන්හිත සන සන්නේ
ඔබේ සෙනෙහසයි මගේ අම්මේ
අසරණ වුදා දිවි කතරේ පිහිට පතන්නේ
ඔබ ගෙනි මා මගේ අම්මේ
දහසක් අය මැද තනිවුන මොහොතේ
සිහියට එන්නේ ඔබ අම්මේ
ආදර සිතුවිලි හද පතුලේ ගිනි ඇවිලෙන
සිත සුවපත් කෙරුවේ මගේ අම්මේ
සැමවිට මාළඟ රැදෙමින් දිරිමත් කළේ
මා ඔබයි මගේ ආදර සුදු අම්මේ

ලාකෝ කුමාර බීඅයිඩී 7 ශ්‍රීලපාහ, සී කණ්ඩායම

## සිතන්න යමක්

ඇස් දෙකක් ඇත්තේ දකින්නට දහසක් ඇත බොහෝ දේ
කන් දෙකක් ඇත්තේ අහන්න රිසි ලෙසින් බොහෝ දේ
අත් දෙකක් ඇත්තේ රට වෙනුවෙන් කරන්නට වැඩ බොහෝ දේ
එක් කටක් තිබුනත් ඇත නොකිය යුතු දේවල් බොහෝ දේ

සෙ/22ඩී00094 කෝප්‍රල් බුද්ධික කුමාර ඩීජී
මූලස්ථානය 16 (සෙවි) ශ්‍රීලපාහ

## පිය සෙනෙහස

හැදූ මුත් කුස තුළ දසමසක්
නුඹේ මව්තුමිය පුත නුඹ
දුරින් හිටියත් රකින්නට
නුඹත් නුඹේ වැඩිමහල් සොයුරියත්
හිත් පිත් ඇතත් මනු සතුන් ළඟ
රක්ෂා කරමි මම ළයක් නැති මිනිසුන් ළඟ
බලා සිටියෙමි පිය නගනු නුඹ
අත්වැල් බැඳන් අක්කණ්ඩිය සමඟ
අකුරු කරන්නට හෙට දින....
අක්කිගේ වැටෙන කඳුළු කැට
පිය නගන්නට නොහැකි බව නුඹ හට
කී නමුදු තේරුම් ගතිමි මම පුත
අක්කිට නොදැනෙන ලෙස
වෛර නොකරනු මැන නුඹ
නුඹේ පියා හට හෙට දින
එන්නට නොහැක මට අද
අත දෙන්න නුඹ හට
බිය නොවන් පුත
මැරෙන තුරු මම
හිඳිමි නුඹ ළඟ සෙවන වී හෙට දින

සැරයන් ආනන්ද ඩබ්ලිව්එම්ඩීපීකේ
බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ

# රෙම ශ්‍රීලපාහ බළලත් නිලධාරී සහ සැ

















රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ අඩු පාඩුවක්ව තිබූ ගොඩනැගිල්ලක් නිවස්න සාමාජික මහතුන්, ශ්‍රීලපාහ ඒකක ජ්‍යෙකොනොනින් සහ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ රෙජිමේන්තුවේ රාජකාරි කර දැනට විශ්‍රාමිකව සිටින මේජර් නිශාන්ත රාජපක්ෂ සහ ධම්මික අකරංගොඩ යන මහතුන්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදි කළ නව ගොඩනැගිල්ල 2012 ජූනි මස 26 වන දින රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන්ගේ සුරතින් විවෘත කරන ලදී. එම විශේෂ අවස්ථාව සඳහා ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම සියලුම ශ්‍රීලපාහ ඒකකයන් හී රෙජිමේන්තු සැරයන් මේජර්වරු හා ජ්‍යොකොනොනින්, විශ්‍රාමික ජ්‍යොකොනොනි විශාල පිරිසක් එක් විය.

එදිනම රෙජිමේන්තු බනි/සැර නිවස්නයේ විශ්‍රාමික සාමාජික මහතුන් සඳහා සිහිවටන බෙදා දීමද සිදු කළ අතර, ඒ වෙනුවෙන් ද රෙජිමේන්තු අධිපතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ ශ්‍රීලපාහ නිලධාරීන් සහභාගි විය. බනි/සැරයන් නිවස්නය වෙනුවෙන් අනූපමය මෙහෙයක් සිදු කළ රෙජිමේන්තු අධිපතිතුමා, විශ්‍රාමික මේජර් නිශාන්ත රාජපක්ෂ සහ ධම්මික අකරංගොඩ යන අය හට කෘත ගුණ දැක්වීම සඳහා රෙජිමේන්තු සැරයන් මේජර් බනි 1 ටීඒ පුෂ්පකුමාර විසින් සමරු තිළින ද ප්‍රදානය කරන ලදී. රෙජිමේන්තු බනි/සැර නිවස්නයේ ඉදිරි දියුණුව වෙනුවෙන් නැවතත් මූල්‍යමය ප්‍රදාන කිරීමක් ද එදින විශ්‍රාමික මේජර් නිශාන්ත රාජපක්ෂ නිලධාරි විසින් සිදු කරන ලදී-. මෙවැනි පරිත්‍යාග සිදු කරමින් බනි/සැරයන් නිවස්නයේ දියුණුව වෙනුවෙන් සිදු කළා වූ දායකත්වය වෙනුවෙන් නිවස්න ගරු සභාපතිතුමා ඇතුලු සියලුම සාමාජික මහතුන්ගේ ගෞරවණීය ස්තුතිය පුද කරන අතර, නන් අයුරින් දායක වූ සැමට ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමු.

**බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නය රෙම ශ්‍රීලපාහ**

# ැරයන් නිවස්නයට නව ගොඩනැගිල්ලක්











# 6 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරි



පුරා වසර 22 ක ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 10 වන අණදෙන නිලධාරි වශයෙන් නි/61758 ලුතිතන් කර්නල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ 2012.05.09 දින දක්වා රාජකාරි කරන ලද අතර, 2012.05.10 දින 0958 පැයට යෙදී තිබූ සුබ මොහොතින් ඒකකයේ අණදීම නි/62440 මේජර් කේජ් පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ භාරගන්නා ලදී.

මෙම ඒකකයේ 11 වන අණදෙන නිලධාරි වශයෙන් නව තනතුරේ රාජකාරි භාර ගන්නා ඔබතුමන් හට ඒකකයේ සියලුම නිලයින්ගේ සුභාශිංසන ගෙන එනු ලබන අතර, අද දින සිට නව තනතුරේ රාජකාරි ගමන ආරම්භ කරන ඔබතුමන්ට ඒ සදහා අවශ්‍ය ශක්තිය ධෛර්යය මෙන්ම දෙවියන්ගේ රැකවරණය හා රත්නත්‍රයේ පිහිට ආරක්ෂාව ලැබේවායි ප්‍රාර්ථනාකර සිටින්නෙමු.



1974.09.08 දින උපත ලද ක්‍රිස්තෝම්බු අසිත පුෂ්පකුමාර කොළඹ තර්ස්ටන් විද්‍යාලයෙන් අපොස උසස් පෙළ දක්වා සිය දැණුම පෝෂණය කර ගෙන උපන් දේශයට ද්‍රෝහිකම් කරන, උපන් දේශය දෙකඩ කර වෙනම රාජ්‍යයක් ගොඩ නගන්නට වෙර දරණ රුදුරු කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් පෙරමුණ ගැනිමටත්, දේශයේ නිදහස් අභිමානය වෙනුවෙන් තම යුතුකම් කොටස ඉටු කරන්නටත් 1993.05.03 දින කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් යුද හමුදාවට බැදී මුලික කෙඩෙට් නිලධාරි පාඨමාලාව පාකිස්තානයේ යුද හමුදා විද්‍යාපීඨය වෙතින් හදාරා ඇත. මූලික යුද පුහුණුව නිමාවෙන් පසු මව් ඒකකය වශයෙන් මෙම බළඇණියට ඇතුළත් වී එතැන් සිට රුදුරු ත්‍රස්තවාදීන්ට එරෙහිව සිදු කළ ක්‍රියාන්විත කටයුතු මෙන්ම ඒකකයේ ඉදිරි පැවැත්ම උදෙසා සිදු කරන ලද පාලන කටයුතු ද, එක හා සමානව ඉදිරියට ගෙන යන්නට අවශ්‍ය සේවය නිසි අයුරු ලබා දී ඇත. බණ්ඩභාර නිලධාරියෙකු වශයෙන් ද, ඒකක බුද්ධි නිලධාරි වශයෙන් ද, විධායක අධිකාරි වශයෙන් ද, පාලන, ආධාරක, ඒ සහ සී යන කණ්ඩායම් වල නිලධාරි අණදෙන වශයෙන් ද, ක්‍රියා හා පුහුණු භාර නිලධාරි වශයෙන් පමණක් නොව අවසන් මානුෂිය මෙහෙයුමේ නිරත වූ මෙම ඒකකය මුහමලේ ඉදිරි ආරක්ෂක වළල්ලේ සිට නනදිකඩාල් කලපු තිරය තරණය කර වෙල්ලමුල්ලි වයික්කාල් යන ප්‍රදේශ අත්පත් කර ගැනීමේ අභිත මෙහෙවරක් කරා රැගෙන යා යුතුව තිබූ තිරණාත්මක සටනට නිවැරදි උපදේශකත්වයක් ලබා දෙමින් ඒකකයේ දෙවන අණදෙන නිලධාරි වශයෙන් ද, කටයුතු කර ඇති අති දක්ෂ යුද සෙන්පතියෙකු බව මෙහිලා සදහන් කළ යුතුය.



සුවහසක් ලංකාවාසී ජන කොටස් වලට අවශ්‍යව තිබූ රටේ නිදහස් නිවහල් බව අත්කර දෙන්නට උතුරු මානුෂීය මෙහෙයුමේ නිරතව සිට මෙම ඒකකය සමඟින් කරන ලද කැප කිරීම වචන වලින් ලියා නිමකළ නොහැකි බව සඳහන් කරන අතර, එම අභීත මෙහෙවරට සෘජුවම දායකත්වය ලබාදුන් නව අණදෙන නිලධාරි තුමනි, ඔබ තුමන්ට ඒකකයේ නාමය තව තවත් ඉදිරියට ගෙන යන්නටත්, එසේ රැගෙන යනු ලබන ඒකකයේ නාමය රන් අකුරින් ලියවන්නටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්යය මෙන්ම ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය නිරන්තරයෙන්ම ලැබේවා! යි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ**

# පස්වන වියට පා තැබූ 11 ශ්‍රීලපාහ



11 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 2007.06.25 වන දින ආරම්භ වූයේ වන්නි මානුෂිය මෙහෙයුමට ඉඳුරාම දායකත්වය ලබාදෙමිණි. එහි විශිෂ්ට වූ ගෞරවයට උරුමකම් කියන අප අභිමානවත් අතිතයක සිට සිය 5 වන සංවත්සරය සමරනුයේ නිහතමානි ආඩම්බරක් සියලු දෙනාගේ සිත් හි දරා ගනිමිණි. ම්ලේච්ඡ කොටි ත්‍රස්තවාදින් හා යුද බිමෙහි බිහිසුණු අවස්ථාවන්ට මුහුණ දෙමින් සිය ඒකකයේත්, රෙජිමේන්තුවේත්, සමස්ත යුද හමුදාවේත් ගෞරවය ආරක්ෂා කරමින් සංග්‍රාමික විනය නිරන්තරයෙන් ආරක්ෂා කරමින් මව්බිමේ නාමය ජාත්‍යාන්තරය හමුවට රැගෙන යනන්ට ජිවිත පරිත්‍යාග කළ හා පූර්ණ ආබාධිත තත්ත්වය පත්වූ සහ දැනට ආබාධිතව පසුවන අපේ විරුවන්ද සිහිකරන්නට අප අමතක නොකළෙමු. ඔවුන් සිහිකිරිම උදෙසා යාපනය නාගවිහාරයේදී රණවිරු අනුස්මරණ පිංකම පැවැත්වූයේ



ඒකකය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ සියලු විරුවන් ගේ නම ඉදිරියෙහි අරලිය මලක් සහ පොල්තෙල් පහනක් තබා උපහාර දක්වමිණි. සදාදරණිය වූ එම රණවිරුවන්ට පිං පැමිනවීම සහ අබාධිත විරුවන් හට සෙත් පැතීම අරමුණු කරගනිමින් යාපනය කණ්දසාමි කෝවිලෙහි විශේෂ දේව මෙහෙයක්ද පැවැත්වූහ. නි/62252 මේජර් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ඒකකයේ අභිමානවත් අතීතය ආරක්ෂා කරමින් කාලින මෙහෙවරෙහි නිරත වෙමින් ඒකකයේ නියමුවා වශයෙන් කාර්යය භාර්යය ඉටු කරනු ලබයි.

ඒකකය සිය පස්වන උපන් දිනය සමරණ මොහොතේ මීට පෙර ඒකකයට නායකත්වය ලබාදුන් අණදෙන නිලධාරිවරුන් වන ලුතිතන් කර්නල් එස්පී විජේසුරිය ආර්එස්පී ශ්‍රීලපාහ, ලුතිතන් කර්නල් ජීඑම්සීකේබී ඒකනායක ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ සහ ලුතිතන් කර්නල් එම්ජීඑන්බී මහතුවක්කාර ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරින්ද සිහිපත් කරනුයේ මහත් වූ ගෞරවයකිණි. සංවත්සර දිනය අර්ථ ගන්වමින් ඒකක දින සංවත්සරය වෙනුවෙන් විශේෂාංග රැසකින් සමන්විතව සමරන්නට වත්මන් අණදෙන නිලධාරි අමතක නොකළේය. ඒකකයේ සියලු හටපිරිස් පිරිස් අණදෙන නිලධාරී වෙත ද කෘත ගුණ සැලකීම වස් 2012.06.25 වන දින පිරිනමන ලද කඳවුරු මුරය හා සම්මාන පෙළපාළිය අභිමානය කැටිවූ ගෞරවාන්විත එකක් කිරීමට



නිලධාරින් හා සෙසුනිලයින්ගේ ඉමහත් ලෙස කැපවිය. කණ්ඩායම් අතර සහයෝගය වර්ධනය කිරීම වස් ක්‍රීඩා තරගාවලියක් පැවැත් වූ අතර, එය සියලු දෙනාගේ සතුට දනවන්නක් විය. ක්‍රිකට් අත්පන්දු සහ මලල ක්‍රීඩා ඉසව්වන්ගෙන් දස්කම් දක්වමින් ඒකකය තුළින් බෝහෝ ක්‍රීඩකයෝ බිහි විය. අත්පන්දු 'සී' කණ්ඩායමද ක්‍රිකට් තරගය 'පාලන' කණ්ඩායම ද ජය ගන්නා ලදී. මලල ක්‍රීඩා තරගාවලියේ ජය 'පාලන' කණ්ඩායම විසින් දිනා ගන්නා ලදී. 2012.06.26 වන දින සියලු නිලයින් නියෝජනය වන පරිදි දිවා භෝජන සංග්‍රහයක් සෙසුනිල භෝජනාගාරයේදී පැවැත්වීමෙන් පසුව 11 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 5වන සංවත්සර අවසන් වන ලදී. අවසන් වශයෙන් ඒකකයේ උනන්තිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ අපේම සදාරණිය විරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර ආබාධිත තත්ත්වයේ පසුවන සියලු රණවිරුවන්ට ඉක්මන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.



**11 ශ්‍රීලපාහ බුද්ධි අංශය**

# සම්බුදු තෙමඟුල සැමරූ 24 ශ්‍රීලපාහ

බුදුරජාණන් වහන්සේගේ තෙමගුල එළඹුණු බැතිබර වෙසක් පුන් හොහෝදා 24 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරින් හා සෙසුනිලයින් විසින් බැතිබර සිතින් යුක්තව සැමරූ වගයි.

2012.05.05 වන දින වව්නියාව මන්නාරම ප්‍රධාන මාර්ගයේ පුදුක්කුලම් හංදියේ දන්සැලක් පවත්වන ලද අතර, බැතිමතුන් මෙන්ම අවට ගම්වාසීන් සහභාගි වන ලදී. එදින 1700 පැයේ සිට මූලස්ථාන පුදුක්කුලම් කඳවුරේදී මහා සංඝරත්නය වැඩමවා සුමදුර ධර්ම දේශනාවක් හා බෝධිපූජා පිංකමක් පවත්වන ලදී.

ආසේමු(ව) හි පවත්වන ලද පහන් කූඩු ප්‍රදර්ශණයට මෙම ඒකකය වෙතින් දර්ශණීය පහන් කූඩුවක් ඉදිරිපත් කරන ලදී.

මෙම ඒකක 'ඩී' කණ්ඩායම ස්ථානගතකර ඇති මොහොත්තාම්කුලම් ප්‍රදේශවාසීන්ට හා බැතිමතුන්ට වන්දනාමාන කිරීම පිණිස අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් 'ඩී' කණ්ඩායම් නිලධාරි අණදෙන නි/65334 මේජර් එන්සී මාරසිංහ ශ්‍රීලපාහගේ අධීක්ෂණය යටතේ 'ඩී' කණ්ඩායමේ සියලුම නිලධාරි හා සෙසුනිලයින්ගේ පරිත්‍යාගයෙන්, ශ්‍රම දායකත්වයෙන්, ඉදි වූ 'හනුමාන් කෝවිල' 2012.05.06 දින අණදෙන නිලධාරි සුරතින් නිරාවරණය කෙරුණි. එදින ප්‍රදේශවාසින්ට සිසිල්පැන් දන්සලක් ලබාදී මහා සංඝරත්නය වැඩමවා සුමදුර ධර්ම දේශනාවක් පවත්වන ලදී. තවද 'ඩී' කණ්ඩායමේ නිලධාරි අණදෙන හා නි/සෙනීන් විසින් පහන් කූඩු 100 ක් දල්වා සිදුහත් කුමරුගේ උපත සිහිගන්වමින් වෙසක් පුන්පෝදා තෙමගුල සමරන ලදී.















මූලස්ථානය 24 ශ්‍රීලපාහ

# ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ අඩ වසරක ප්‍රගතිය

2012 වසර සඳහා අභිනවයෙන් පත්වූ නව නිලධාරි මණ්ඩලයට නායකත්වය ලබාදෙමින් ගරු සභාපති මේජර් ජෙනරාල් ටීටීආර් ද සිල්වා (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් හා මඟ පෙන්වීම මත පසු ගිය මාස 06ක කාලය තුළදී ඉතාමත් සාර්ථක ලෙස විශාල රාජකාරීම සුබසාධක තීන්දු තීරණ ලබාදුන් අතර, මේ සඳහා කමිටු සාමාජිකයන්ගෙන් සැදුම් ලත් මණ්ඩල කිහිපයක් ද පත් කර එම කමිටු තීරණ මත පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කරන ලදී.

අප සංගමයේ පරිපාලන කටයුතු සිදුකර ගැනිමට විශාල අඩුපාඩුවක්ව තිබූ කාර්යාලයක් හා කාර්ය මණ්ඩලයක් අප සංගමයේ ඉල්ලීම තුළින් ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපතිතුමා ගේ උපදෙස් මත රෙජිමේන්තු පරිශ්‍රය තුළ ලබාදී ඇත.

**නව ලිපිනය**
**ගරු සභාපති/ගරුලේකම්**
**ශ්‍රී ලංකා පාබල හමුදා සංගමය**
**රෙම ශ්‍රීලපාහ**
**යුද හමුදා ජනපදය**
**පනාගොඩ - හෝමාගම**

**දුරකථන අංකය 011-3185815**

- ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ ව්‍යවස්ථාව කාලින අවශ්‍යතාවන් අනුව සම්පාදනය කර මුද්‍රණය කිරීම. (2012 පෙබරවාරි 26 දින සම්මත කරගත් සංශෝධනයන් සහිතව)
- උප සංගමය මඟින් ඉටු කරනු ලබන සුබසාධක කාර්යයන් විධිමත් කිරීම.
- මේ යටතේ මෙතෙක් මාසික කමිටු රැස්වීම් තිරණ මත ඉටුකළ සුභසාධක කටයුතු වඩාත් විධිමත් කර සාමාජිකයන්ට වඩාත් ඵලදායි ක්‍රමවේදයක් තුළින් වරප්‍රසාද ලබාදීමට මණ්ඩලයක් පත්කර මණ්ඩල තීරණ අනුව කටයුතු කිරීමට ක්‍රියාකර ඇත.
- පෞද්ගලික බැංකුවල ඉතා අඩු පොලිය මත ස්ථිර තැන්පතු ගිණුම්වල තිබූ හා ලැබුණු සාමාජික මුදල් එක්කර රුපියල් 8,500,000.00 මුදලක් 14.5% වැඩි ඉහළ පොලී අනුපාතයක් යටතේ රාජ්‍ය බැංකුවක් වන ලංකා බැංකුවේ ස්ථිර තැම්පත් වශයෙන් තැම්පත් කිරීම. ඒ මඟින් විශාල පොලී ප්‍රමාණයක් සංගමය වෙත ලබාගැනීමට හැකිවීම.
- සාමාජිකයන්ගේ විශාල සුභසාධක කටයුත්තක් වන මරණාධාර මුදල් රුපියල් 15,000.00 සිට 50,000.00 දක්වා වැඩිකර එය 2012 සැප්තැම්බර් මස 01 දින සිට ලබාදීමට ක්‍රියාකිරීම ( මෙම වරප්‍රසාදය මේ වනවිට සාමාජික මුලු මුදල ගෙවා ඇති සාමාජික  මහතුන්ට පමණක් හිමිවේ)
- අවිධිමත් ලෙස පවත්වාගෙන ගිය ගිණුම් කටයුතු විධිමත් ලෙස හමුදා පිළිවෙත් ප්‍රකාරව (**AB 21**) ක්‍රමවේද අනුගමනය කරමින් පවත්වා ගෙන යෑමට කටයුතු කිරීම.
- කමිටුව සහ සාමාජිකයන් අතර මනා සම්බන්ධතාවය නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා සංගමය වෙත **CDMA** දුරකථනයක් ලබා ගැනීම.
- සියලු සාමාජික මුදල්/පරිත්‍යාග මුදල් ගිණුම්ගත කිරීමට හැකිවන පරිදි නව ගිණුමක් ලංකා බැංකු හෝමාගම ශාඛාවේ ආරම්භ කිරීම. මේ තුළින් සාමාජික මුදල්/පරිත්‍යාග මුදල් අතට නොගෙන ඉඳුරාම බැංකුගතවීම ( 73164496 ලංකා බැංකුව හෝමාගම ශාඛාව)
- සම්පූර්ණ සාමාජික නාමලේඛණය දිස්ත්‍රික්ක වශයෙන් වෙන් කර පොතක් ලෙස පිළියෙල කර ඇත.
- විධිමත් ලෙස දිස්ත්‍රික් කමිටු පත්කර ඒ සඳහා එක් දිස්ත්‍රිකයේ සියලු නිලයන් නියෝජනය වන පරිදි 10 දෙනෙක් යුත් සාමාජික කාණ්ඩායම් පත් කිරීම හා ඔවුන්හට රාජකාරිය පවරාදීම.
- මෙයට අමතර මාස 03කට වරක් ඔවුන් කමිටු රැස්විම් වෙත ගෙන්වා අවශ්‍ය උපදෙස් ලබාදීමට ක්‍රියා කිරීම (සාමාජිකයන් 02 බැගින්)

ඉහත සදහන් සියලු ක්‍රම වේදයන් තුළින් අප සංගමයේ දියුණුව හා සාමාජික මහතුන් හට වැඩි වරප්‍රසාද ලබාදීමට ඇති හැකියාව වැඩි වන බැව් පෙන්වා දෙන අතර ඔබතුමන්ලාගේ අදහස්/යෝජනා සහ අනුශාසනකත්වය ද, අප සංගමය වෙත ඔබ විසින් දක්වන සහයෝගය ද, ඉතා අගය කොට සලකමි.

ශ්‍රී ලංකා පාබල හමුදා සංගමය

## අස්තිර ජීවිතය

නිල තාරාතිරම්
නම්බු නාම මත
සියලු දේ තාවකාලික
වූ ලොවක
අප රඟන රඟ මඩල
අවසන හිමි තැන
අඩි සයක අයිතියවත්
මහ පොළොවේ අපහට...

ලුතිතන් මිහිර ශාන්ත ශ්‍රීලපාහ
2(සෙව්) ශ්‍රීලපාහ

## සඳ හා තරු

ඔබ සඳ මඩලයි සිත් අහසේ
මා ඔබ අභියස දිදුලන තරුවකි
නිසල රැයට ආලෝකය සඳ තරු
යලි හිමිදිරියේ සැඟවෙන්නේ

අමාවකය සඳ නැහැ අහසේ
තරුට දුක හිතෙයි සැන්දෑවේ
සඳ නැති පාළුව දරාගන්න බෑ
තරු වැලපෙයි සැඟවී වලාකුලේ

අමාවකට සඳ සැඟවී ගියමුත්
ලෝකයේ ස්වභාවය එයයි මෙදා
හඬා වැටෙන්නට දෙන්න එපා
මේ තරුව ඔබේමයි වෙන්නේ සදා

සෙ/327759 සාසෙ සම්පත් කුමාර එම්ජීබී
බී කණ්ඩායම - 24 ශ්‍රීලපාහ

## පැතුම

ඥානවත් මිනිසෙකු
පමණක් වී නොව
ගුණවත් මිනිසෙකු
වෙලා යළිත්
අප හමුවෙමු
මතු සංසාරේ

**ලාකෝ නිශ්ශංකසිරි ආර්එම්**
**ආධාරක කණ්ඩායම 24 ශ්‍රීලපාහ**

## මව්පියන්

දසමස කුස දරා මෙලොවට බිහිකර අම්මා
ලේ කිරිකර පොවා ඇති දැඩිකළ අම්මා
කුස ගිනි නිවන්නට කුලියට ගිය අම්මා
අපරක ගනියි ඇස්දෙක වගෙ අපෙ අම්මා

ගොවිතැන් බත් වලට මුල්තැන දුන්න පියා
කඩිසර කමින් උදය මොහු වැඩට ගියා
නිසි මග යවන්නට කැපවුනු ගෙදර පියා
වදිනෙමි පියානෙනි ඔබහට නළල තියා

පාසල් යවන්නට මග දුන් මව්පියෝ
ජයමග පතාගෙන ආපහු සිනාසුනෝ
ඉදිමග යවන්නට කැපවුනු මව්පියෝ
සංසාරෙම පතන්නෙමි අපෙ මව්පියෝ

මහගිනි අව්වෙ වැඩකරමින් සිටින්නේ
ජීවත් වෙන්න කුලිවැඩමයි කරන්නේ
දුක් කඳු බිඳී අප ගැනමයි සිතන්නේ
මව්පියනි ඔබට දීඝායුෂ පතන්නේ

කිසි දිනකවත් නෑ සිත් බිඳ දමන්නේ
කීකරු කමින් සැමදින ළඟ සිටින්නේ
නොරිදා සිතක් මෙන් කඳුළැලි ගෙනෙන්නේ
වදිනෙමි දෙපා වදිනෙමි මව් පියන්නේ

කල්ගත වුවත් නෑ පෙරුමන් පුරන්නේ
ජාති භේදයක් නෑ සැම රකින්නේ
සැමටම එකාවගෙ පැතුමක් පතන්නේ
මව්පියන් ඇස්දෙක වගෙ රකින්නේ

**සෙ/330396 සාසෙ කුමාර ඩබ්එම්ඩීජ්**
**අණ සහ පාලන කණ්ඩායම 15 ශ්‍රීලපාහ**

## සෙබළ ජීවිතය

රට ජාතිය ආගම ගැන සිතා
තරුණ විය යුද බිමට කැප කළ
මා හට තරුණ වියෙහි තිබූ
කායික මානසික හා සමාජීය
නිදහස යම් නීතිරීති වලට
සීමා වී දහසකුත් රුදුරු
බාධක මැද දිවි ගත කළ
මා හට ඔබ හමුවූ දින
සිට මගේ හදවතේ
දුක් වේදනා දහසකුත් ගැටළු
මැනවින් තේරුම් ගනිමින්
මුළු ජීවිතයම ජය ගන්නට
ශක්තියක් වූයේ ඔබ වැනි
අවංක හදක් ඇති
බිරිඳක් ලද නිසාමය

**සාසෙ සඳරුවන් එල්ජ්**
**සී කණ්ඩායම 8 ශ්‍රීලපාහ**




## සොදුරු දිවිය

සොඳුරු වාස්සානය ද
කටුක වූ ගිම්හානය ද
ඔබේ දිවියට ළඟා විය හැකිය
එසේ නම් වස්සානයේ හිනැහුන ඔබ
ගිම්හානයේ නොතැවෙන්නට
නොසැලෙන පර්වතයක් සේ
බාදක ඉදිරියේ සිට ගන්න
ආලෝකය විහිදුවන මැණිකක් සේ
ජීවිතය ජය ගන්න.....

කෝප්‍රල් බස්නාගොඩ බීඑස්බී
1 ශ්‍රීලපාහ

## සෙබළ ප්‍රාර්ථනාව

පහන් සිලක් සේ නෙතු දැල්වේවා
වසන්තයක් සේ දිවි සරුවේවා
පියුම් විලක් සේ සුවඳ සැදේවා
මේ මව්බිමේ සාමය මල් පිබිදේවා

**සාසෙ විජේතිලක එච්පී**
**සී කණ්ඩායම 24 ශ්‍රීලපාහ**

## ආදර සෙනෙහස

සඳ කොතැන ගියත්
අඳුරට එළිය දෙනවා නේද
මල් කොහේ පිපුනත්
ඔබ රූ ඇදෙනවා නේද
ගඟ කොහේ ගියත්
මුහුදට ගලනවා නේද?
ඔබ කොහේ ගියත්
මගේ පිවිතුරු හදවත
අමතක නෑ නේද?

**සාසෙ සම්පත් ආර්පීආර්**
**සී කණ්ඩායම 8 ශ්‍රීලපාහ**

## ඔබෙ පුතු රණබිමේ අම්මේ

පළමුව වදිමි සම්මා සම්බුදු පාද
දෙවනුව සිතට මව්පියො සිහිවෙයි නේද
තෙවනුව ලබා සරසවි මෑණිගේ පාද
තබනව මෙතැන් සිට සරසවියට පාද

දස මස කුස හොවා මා දැඩි කළ අම්මේ
පාසැල් යවා මට නුවණැස දුන් අම්මේ
රතු ලේ සුදු උනේ මට බොන්නද අම්මේ
දැඩිකළ ඔබෙ පුතු අද රණබිමේ අම්මේ

තනියට නොතනියට හිටියෙත් අම්මාය
බත්පත බෙදා දුන්නෙත් මට අම්මාය
දුක සැප සොයා බැලුවෙත් මගේ අම්මාය
ඉරහඳ වෙලා පායන්නෙත් අම්මාය

**සෙ/323606 ලාකෝ සඳරුවන් ඩබ්ඩීසී**
**15 ශ්‍රීලපාහ අණ සහ පාලන කණ්ඩායම**

## අහිමි ප්‍රේමය

Delete කරන්නට සිතුනි
ඔබේ පෙම්
අහිමි නිසා මට
Save කර නැවත බැලුවෙමි
හිමි වේ දැයි කියා මට
අහෝ දුකකි
Save කර තිබුණේ මම
අන්සතු Folder යක්
තුලය ඔබේ සිත
Rename කර මගේ නම
පනින්නට සිතුව ද ඔබ තුළට
මට ඇතුලු විය නොහැකි සේ
Passward දමා තිබුණි ඇය

**ලාකෝ පූංචිහේවා කේජීඑස්**
**ඒ කණ්ඩායම 1 ශ්‍රීලපාහ**

# යුද හමුදා මාර්ග ධාවන තරඟාවලිය - 2012



ශ්‍රී ලංකා යුද හමුදා මලල ක්‍රීඩා කමිටුව විසින් 47 වන වරටත් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු මාර්ග ධාවන තරගාවලිය මෙවරත් 2012 මැයි මස 20 වන දින අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. යුද හමුදාවේ සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩකයින් 98 දෙනෙකු තරග කළහ.

ක්‍රීඩා අමාත්‍යංශයේ ක්‍රීඩා උපදේශකයෙකු වන ලක්ෂමන් කුලරත්න මහතා විසින් මිනුම් ගත කරන ලද මාර්ග ඔස්සේ මෙම තරඟය පැවැත්වූ අතර, එදින 0615 පැයට රාජගිරිය මංසන්දියෙන්, යුද හමුදා මලල ක්‍රීඩා සංගමයේ සභාපති හා අප රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන්ගේ සංඥාවෙන් තරඟය ඇරඹින. පාර්ලිමේන්තු වටරවුම, බත්තරමුල්ල, කොස්වත්ත හංදිය, තලංගම, මාලඹේ, අතුරුගිරිය, ගොඩගම හංදිය ඔස්සේ පනාගොඩ යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල ඉදිරිපිටින් ක්‍රීඩකයෝ තරඟය අවසන් කළහ.

යුද හමුදා මලල ක්‍රීඩා සංගමයේ පූර්ණ අධීක්ෂණය යටතේ පැවති අතර, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයින් රැසක් තරග වැදි නිසාවෙන්ම ඉතාමත් උණුසුම්



තරගාවලියක් දක්නට ලැබුණි. තරගකරුවන් වෙනුවෙන් සහයෝගය දක්වීමට මග දෙපස ජනතාව රැස්වී සිටි අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් ඔවුන්ගේ නියාමක රථ මගින් ඔවුනට ඉඩ ප්‍රස්ථාව හා ආරක්ෂාව සපයන ලදී.

කෙසේ වෙතත් කණ්ඩායම් තරගයක් වශයෙන් පැවති මෙම මාර්ග ධාවන තරගාවලිය සඳහා එක් රෙජිමේන්තුවකින් ක්‍රීඩකයින් 07 දෙනෙකු පමණක් සහභාගි කරවීමට අවස්ථාව සලසා තිබූ අතර, ඔවුන් අතුරින් තරඟය අවසන් කරනු ලබන ප්‍රථම ක්‍රීඩකයින් 05 දෙනාගේ කාලය ගණනය කරමින් ජයග්‍රාහී රෙජිමේන්තුව නම්කරන ලදී. සියලුම තරඟ කරුවන් අතුරින් මෙවරත් ප්‍රථම ස්ථානය දිනාගන්නා ලද්දේ යුද හමුදා සේවා බළකායේ බළලත් නිලධාරි 1 ඒඑම් අජිත් බංඩාර, දෙවන ස්ථානයට හිමිකම් කියනු ලැබූයේ එම රෙජිමේන්තුවේම ලාන්ස් කෝප්‍රල් සමන් කුමාර කේපීආර් හා තෙවන ස්ථානය දිනාගන්නා ලද්දේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ගුණසේකර ඊකේකේඑස්එම් විසිනි. ඒ අනුව තරගාවලියේ සමස්ත ශූරතාවය යුද හමුදා සේවා බළකායටත්, අනු ශූරතාවය ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවටත් හිමි වූ අතර, තෙවන ස්ථානය දිනාගන්නා ලද්දේ ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායමයි.

**ශ්‍රී ලංකා පාබල හමුදා මාර්ග ධාවන කණ්ඩායම**

| | | | |
|---|---|---|---|
| සෙ/14ඩී01057 | කෝප්‍රල් | අජන්තන් | එම් |
| සෙ/317742 | ලාකෝ | දිනුරංග | වීපීජ් |
| සෙ/317827 | සාසෙ | බණ්ඩාර | ටීපීජ් |
| සෙ/ඩී100555 | සාසෙ | පිගේරා | ඒඑල්පීකේ |
| සෙ/ඩී100619 | සාසෙ | විජේසිංහ | ඩබ්එච්පීඑන්සී |
| සෙ/ඩී100779 | සාසෙ | කුමාර | කේජේ |
| සෙ/ඩී100786 | සාසෙ | බණ්ඩාර | ආර්එම්වයිපීඑන් |

**රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය**



# 20 ශ්‍රීලපාහ තෙවැනි අණදෙන නිලධාරී

වර්ෂ 2008 ක් වූ උඳුවප් මස 01වන අඟහරුවාදා දින සුබ මොහොතින් මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කල මිහින්තලය පුද බිමේ මහකනදරා වැව ඉස්මත්තේ ඇති සුන්දර පරිසරයක පිහිටි මිහින්තල කඳවුරේදී ප්‍රහාරක බළඇණියක් වශයෙන් මෙම ඒකකය ආරම්භ කළහ. මානුෂීය මෙහෙයුමට විශේෂ දායකත්වයක් ලබා දෙමින් ඉතා කෙටි කාලයකදී විශාල යුද ජයග්‍රහණ රාශියක් ලබාගෙන ක්‍රියාන්විත රාජකාරි උසස් අයුරින් ඉටු කරන ලදී. දැනට කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් පුනරින් ප්‍රදේශයේ 66 සේනාංකය සමග 662 බසේමු යටතේ රාජකාරින්හි නියුතුව සිටින අතර, නැවත පදිංචි කරන ලද සිවිල් ජනතාවගේ සුබසාධනය සඳහා සුවිශේෂ දායකත්වයන් ලබා දෙමින් රාජකාරින් ඉටු කරනු ලබයි.





ලුතිතන් කර්නල් ඊජ්පී එදිරිවීර ශ්‍රීලපාහ ගේ අණදීම යටතේ ස්ථාපනය කෙරුණු මෙම බලඇණිය තම සිව්වන වසර ගෙවීයන මොහොතේ ඒකකයේ ඒකකයේ නියමුවා ලෙසින් කටයුතු කළ නි/61024 කර්නල් පීජේපී ගමගේ ආර්එස්පී ශ්‍රීලපාහ විසින් නි/62548 මේජර් අයිපී ජයසිංහ ශ්‍රීලපාහ හට 2012.06.07 දින පෙරවරු 1003 පැයට යෙදුනු සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරි තනතුරේ රාජකාරින් භාරදීම්/භාරගැනිම් සිදු කරන ලදී. ඒකකයේ තෙවැනි අණදෙන නිලධාරි වශයෙන් සුබ මුර්තියෙන් රාජකාරි ඇරඹූ මේජර් අයිපී ජයසිංහ ශ්‍රීලපාහ 1993.01.04 දින කෙඩෙට් නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා යුද හමුදාවට බැදී වසර 19 කට අධික කාලයක් දිවයිනේ විවිධ ප්‍රදේශවල ක්‍රියාන්විත රාජකාරින් හී යෙදී අත්දැකීම් බහුල ජොෂ්ඨ නිලධාරියෙකි. නව අණදෙන නිලධාරිතුමා හට 20වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පාබල අඹරේ දිලෙන තාරුකාවක් බවට පත් කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය නොඅඩුව ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

**මූලස්ථානය 20 ශ්‍රීලපාහ**





# වික්ටෝරියා ක්‍රොස් සම්මානය



සතුරා අභිමුවෙහි තම නිර්භීත කම ප්‍රදර්ශණය කරන්නා වූ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් වල හා එකල බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය යටතේ තිබූ රටවල හමුදාමය සාමාජිකයින් වෙනුවෙන් ප්‍රධානය කරන්නා වූ ඉහළම වික්‍රම සම්මානය 'වික්ටෝරියා ක්‍රොස්' නමින් හැඳින්වේ.

පදක්කම් අනුපිළිවෙලෙහි ඉහලම ස්ථානය මෙම පදක්කමට හිමි වන අතර ඕනෑම නිලයක සේවයේ යෙදී සිටින සමාජිකයෙකු හට හෝ ඔහුගේ නියෝජිතයෙකුට මෙම (මියගොස් ඇතිවිට) පදක්කමට හිමිකම් ලැබිය හැකිය. එක්සත් රාජධානියේ මෙම පදක්කමට හිමිකම් ලාභීන් සඳහා පදක්කම් පැළඳවීම සිදු කරන්නේ රජතුමන් හෝ රැජිනිය විසින් වන අතර උත්සවය බකිංහැම් මාළිගාව තුළදී සිදු කරනු ලබයි.

1856 ජනවාරි මස 29 දින වික්ටෝරියා රැජින විසින් මෙම සම්මානය හඳුන්වා දී ඇත්තේ ක්‍රිමියන් යුද්ධයේදී තම නිර්භීතභාවය විදහා දැක්වූ සාමාජිකයින් වෙනුවෙනි. මේ වනවිට ලෝකයේ සාමාජිකයින් 1353 දෙනෙකු මෙම සම්මානය ලබා ඇති අතර ඉතා ප්‍රකටව පෙනෙන වික්‍රමයන්, විශිෂ්ට ජීවිත පරිත්‍යාගයෙන් යුතුව සිදු කරන වීර පරාක්‍රමයන් හෝ සතුරා ඉදිරියේ තම රාජකාරිය පිළිබඳ තිබූ ශූර වීරතාව උපරිම කැපවීම පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව මෙම සම්මානයෙන් පිදුම් ලැබීම සිදුකරයි.

වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ

# දුප්පත්කම

නැතිබැරි කම නිසා යුදබිමේ සටන් කළා
ජීවය රැකගන්න විසිදෙක සයින් කළා
එකමුතු කමින් ඉදි පියවර ගමන් කළා
දුප්පත් මා හට පාබල විරුවන් උදව් කළා

දුප්පත්කම නිසයි අපි දුක් විදින්නේ
අසරණ කමින් අන් අය දෙස බලන්නේ
ජීවය ගැන සිතා මෙහෙයුම රකින්නේ
ඉදි මග ජයගන්න පැතුමක් පතන්නේ

අතපය ශක්තියේ ජවයෙන් වෙහෙසෙන්නේ
දුක්කඳු බිඳී ඉදි නැගුමට සැරසෙන්නේ
දහදිය හෙලා මහවන මැද ගැවසෙන්නේ
දුප්පත් කමයි අප කාටත් ඇති වෙන්නේ

**සෙ/315994 කෝප්‍රල් සේරසිංහ යූජ්ඡ්බී**
**අණ සහ පාලන කණ්ඩායම 15 ශ්‍රීලපාහ**

# හමු (නො) වීම

ඇස ගැසුනු සඳ සබඳ
ඇලීමක් විය නොමද
පෙර සසර මග සුවඳ
දැනෙයි හද මැද නිබඳ
සත සහස් කප් කලකදී
මෙ ගමන් මඟ තුළදී
නවාතැන් පොලොවෙදී
හමුවෙලා ඇති මුලදී
ගමන් මින් නතර කර
නිමාකොට දුක් සසර
නිවන් දොර විවර කර
යළි හමු නොවෙමු

සෙ/325345 සාසෙ ප්‍රසන්න ඒඑම්ජ්
බී කණ්ඩායම 24 ශ්‍රීලපාහ

# ආදරණීය දියණියේ

ඔබ ආවදා පටන් මට වාසනාව ළඟා වුණා
ඔබේ අහිංසක සිනහව සැමදා මුව අඟ රැදුණා
මොනවා කරන්නද සුදු දියණියේ මා අසරණ වෙන්නා
කිසිදින ඔබේ තාත්තාට ඔබ අමතක නොම වෙන්නා

මා ජිවත් වෙන්නෙත් ඔබ සිටිනා හින්දා
ඔබහට මේවා නොතේරෙන්නේ තවමත් පොඩි හින්දා
මියයන තුරුම මා සුදු දෝනිට ආදරේ හන්දා
මේ විදියට ලියන්නේ මගේ දුක වැඩි හන්දා

මා දුර ඈතක සිටියත් ඔබ නිතරම සිහි වෙනවා
ඒ හැම මොහොතකම නෙතු කඳුළින් බර වෙනවා
කියන්න කවුරුත් නැති හින්දා දෙවියන් හට පවසනවා
මේ විදියට ඉතින් රන් හා වටින කාලය ගෙවිලා යනවා

දිලූෂාණි දුවට කිසිදා කරදරයක් නොම වේවා
ඔබේ දිවිමග සැමදා යස ඉසුරින් බර වේවා
මටවත් දුකක් කිසිදින ඔබ හට නොම වේවා
අහිංසක සුදු දියණිය මගේ සැම දෙවියන් රැකදේවා

සෙ/311084 ලාකෝ උදය කුමාර ආර්ඩබ්
25 ශ්‍රීලපාහ

# උමතු ආදරය

ඉරක් වෙන්න පෙරුම් පුරන්නී ...
ඉරබටු තරුවේ ...
බිඳක් අඳුර දුරු කරන්න ඒ ඇති අහසේ ...
ගිමන් නිවන සිසිල සඳන සිහිල් සුළගේ ...
මද නලක් වෙන්න කුණාටුවක් නොව ආදරේ ....

ලාකෝ කරුණාතිලක ටීඑස්පී
සී කණ්ඩායම 8 ශ්‍රීලපාහ

# සේවා වනිතා විත්ති





2012.06.05 දින පොසොන් පොහොය නිමිති කරගෙන මියගිය රණවිරුවන්ට නිවන් සුවය ප්‍රාර්ථනා කරමින් හා සේවයේ යෙදී සිටින රණවිරුවන්ට නිදුක් නිරෝගි සුවය ප්‍රාර්ථනා කරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූලිකත්වයෙන් සුමදුර ධර්ම දේශනාවක් පවත් වන ලදී.

**2012.06.14 දින**

සෙ/307929 සැරයන් අජිත් හේමවංශ වී යන ජෝකොනොනිගේ ශ්‍රවණ බාධයෙන් පෙළෙන දරුවා වෙත ශ්‍රවණාබාධක කට්ටයක් මිළදී ගැනිම සඳහා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් රුපියල් 50,000.00 ක් වැයකර එම ශ්‍රවණාබාධ කට්ටලය එම දරුවා වෙත ගරු සභාපතිනිය විසින් පරිත්‍යාග කළ අවස්ථාව.





නි/60708 කපිතන් (උපා) ඩබ්පීජ්ඩී පෙරේරා ශ්‍රීලපාහ (මියගිය) යන නිලධාරිගේ බිරිඳට වැළදී ඇති ලියුකේමියා රෝග යට ප්‍රතිකාර ලබා ගැනිම සඳහා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනියගෙන් කරන ලද ඉල්ලීමක් අනුව සේවාවනිතා ශාඛාව වෙතින් රුපියල් 50,000.00 ක මුදලක් එම නිලධාරිගේ පුත් ඩබ්පීජ් මංජුල සංජය පෙරේරා මහතා වෙත ගරු සභාපතිනිය විසින් පරිත්‍යාග කරන ලදී

සෙ/300963 සැරයන් රොෂාන් කුමාර ජීඑච්අයි යන ජෝකොනොනිගේ බිරිඳට වැළදී ඇති පිළිකා රෝගයට ප්‍රතිකාර ලබා ගැනිම සඳහා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනියගෙන් කරන ලද ඉල්ලීමක් අනුව සේවාවනිතා ශාඛාව වෙතින් රු. 50,000.00 ක මුදලක් ගරු සභාපතිනිය විසින් පරිත්‍යාග කරන ලදී.








**2012.05.05 දින**

වෙසක් පුන් පොහොය නිමිති කර ගෙන ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් කඩල දන්සැළක් පැවැත් වූ අවස්ථාව.





**2012.05.13 දින**

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් වාර්ෂිකව පවත්වනු ලබන රෝහල් සංචාරය අනුරාධපුර අභිමංසලේදී සිදූ කළ අතර, එහිදී එම රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා කායවර්ධන ව්‍යායාම කට්ටලයක් පරිත්‍යාග කරන ලදී





2012.05.23 දින

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ නිවාස සංකල්පය අනුව සෙ/15056 කෝප්‍රල් කරුණාරත්න ඒඑම් යන රණවිරුවා වෙත නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදී.





**2012.07.19 දින**

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ සම්බන්ධිකරණයෙන් රටට ජාතියට හිතැති පුද්ගලික සමාගමක කාර්ය මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ආබාධිත රණවිරුවන් වෙත අත්වාරු යුවල් පරිත්‍යාග කිරීමේ උත්සවයක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත් වූ අවස්ථාව.

# 19 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරි





19 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලැබූ නි/61251 ලුතිතන් කර්නල් ජීඩීවයිආර් පෙරේරා ආර්එස්පී ශ්‍රීලපාහ ඒකකයෙන් සමුගත් අතර, නව අණදෙන නිලධාරි තනතුර



සඳහා නි/62291 මේජර් ටීඑන්කේ පෙරේරා ශ්‍රීලපාහ 2012.06.08 වන දින ඒකකය වෙත පැමිණෙන ලදී. එම සුවිශේෂී දිනය වෙනුවෙන් සම්මාන මුරයක් පිරිනමා එදිනට යෙදුන සුබ මොහොතින් පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව 19 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරි තනතුරේ රාජකාරි භාර ගන්නා ලදී.

සුබ මොහොතින් 19 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි වශයෙන් වැඩ භාර ගැනීමෙන් අනතුරුව සියලුම නිලයින් විසින් පිළියෙල කර තිබූ තේ පැන් සංග්‍රහයට සහභාගි විය. ඉන් අනතුරුව සියලුම නිලයින් අමතා හරවත් දේශණයක් කළ අණදෙන නිලධාරි වසර 20 ක තම යුද හමුදා ජීවිතයෙන් ලද පන්නරය හා අත්දැකීම් ඇතිව යුද හමුදාවේ වගකිව යුතු ස්ථාන කිහිපයකම රාජකාරි කර මෙම ඒකකයේ නව අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කිරීමට ලැබීම ගැන ඉමහත් සතුටට පත්වන බවත් සියලු නිලයින්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් දන්වා සිටින ලදී.

නව අණදෙන නිලධාරි 19 ශ්‍රීලපාහ බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට පාබල ඒකක අතර සුවිශේෂී ඒකකයක් බවට පත්කිරීමට අවශ්‍ය නායකත්වය, මගපෙන්වීම ලබා දීමට අවශ්‍ය ධෛර්යය නොඅඩුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමි.

බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ

## පියා ලියූ කවිය

සී මැදුරු කවුළුවෙන්
පහත මාලය බලන
නුඹට මා නොපෙනේය
මා සිටින්නේ දුරය
අපේ ඇත්තන් අතර
මගේ මේසන් හැන්ද
තැනූ පිය ගැට පෙළින්
නුඹ ඉහළ මාලයට ගියත්
මා තවම මෙහි
අපේ ඇත්තන් අතර
බදාමය සව්වුනා
සැටලිමද ගැලවුනා
මව් සෙනේ පිය ගුනේ
තවද නැහැ වියකුනේ
අපේ ඇත්තන් අතර

**සෙ/327101 සාසෙ කුලතිලක එච්විඑස්**
**බි කණ්ඩායම - 24 ශ්‍රීලපාහ**

## අමාවක පුන් සඳ

අමාවක සඳ අහසේ
පෙව් පුන් සඳ විලසට
තෙරක් නොමැති මහ සාගරයට
ලංවූ වෙරලක් විලසට
ඉමක් නොදැන ගලා හැලෙන
නදියට ගංතෙරක් විලසට
දුක හා සැප දෙක අභියස
සෙවනැල්ලක් සේ පසුපස
මහා දුර ආවේ නොකියම ආපසු යන්නද?

ලාකෝ යසවර්ධන කේඑච් ~ සී කණ්ඩායම ~ 8 ශ්‍රීලපාහ

# ආසේමු (කිලි) ආඥාපති තුමාගේ 19 ශ්‍රීලපාහ සංචාරය

ආසේමු (කිලි) ආඥාපති මේජර් ජනරාල් ජීවීඩීයූජ් පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් 2012.07.16 දින 19 ශ්‍රීලපාහ මුලංකාවිල් කඳවුරේ සංචාරයක් සිදු කරන ලදී. එහිදි එතුමා වෙත සම්මාන මුරයක් පිරිනැමීමෙන් පසු සියලුම නිලයන් ඇමතීම සිදු කළේය. මෙම දේශණය සඳහා ඒකකයේ සෙනින් සහ මෙම ප්‍රදේශයේ ස්ථානගත අනෙකුත් ඒකක භටපිරිස් 500 ක් පමණ සහභාගි වූයේය. ඉන් අනතුරුව එතුමාගේ සංචාරයේ ප්‍රධාන අරමුණක් වන දැනට පවතින තත්ත්වය හා සිවිල් ජනතාව සමඟ ඇති සුහදශීලී රාජකාරි ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම බැවින් අණදෙන නිලධාරි නි/62291 මේජර් ටීඑන්කේ පෙරේරා ශ්‍රීලපාහ විසින් ඒ සම්බන්ධව හා ඒකකයේ රාජකාරි පිළිබඳ ඉදිරි සැලැස්ම ගැන විස්තර ඉදිරිපත් කළේය. රෙජිමේන්තු සැරයන් මේජර් සෙ/302809 බනිI





ආර්එම්සී රත්නායක විසින් රාජකාරීන්, වගකිම්, ඒකක බල ප්‍රදේශයේ සිවිල් ජනයාගේ හිත් දිනා ගැනීමට ගෙනඇති ක්‍රියාමාර්ග පිළිබඳව විස්තර ඉදිරිපත් කරන ලදී. ඉන් අනතුරුව බලඇණි ජ්‍යෙෂ්ඨතම කොනොනි විසින් ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ කොනොනි සතු රාජකාරි, වගකීම්, ක්‍රීඩා කුසලතා හා රාජකාරි කරනු ලබන අයවලුන්ගේ ගැටලු හා අවශ්‍යතාවයන් පිළිබඳව සෙ/313972 කෝප්‍රල් ප්‍රසන්න එස්ඒඩීජ් විසින් ඉදිරිපත් කරන ලදී. 19 ශ්‍රීලපාහ දේශණ ශාලාවේ පැවති මෙම ඉදිරිපත් කිරීම සඳහා ආසේමු (කිලි) ආඥාපතිතුමාද, 65 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ආර්පී ද සිල්වා අයිජී, 651 බසේමු බලසේනාධිපති කර්නල් සීඑම්බීපී චන්ද්‍රසේකර යන ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා එම උසස් මුලස්ථාන වල විවිධ තනතුරු මෙහෙයවන ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද සහභාගි වූයේය. මෙය ඉදිරිපත් කිරීම විශේෂත්වයක් වූයේ පරිඝණක භාවිතයෙන් මල්ටිමීඩියා හරහා පුළුල් තිරයේ ප්‍රදර්ශණය කිරීමයි. මෙම ඉදිරිපත් කිරීම් ආසේමු (කිලි) ආඥාපති හා පැමින සිටින අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ ප්‍රසාදයට ලක්වු බැව් ඉතාමත් අභිමානයෙන් යුතුව සඳහන් කරමි. ඉන් අනතුරුව කඳවුරු භූමිය පිළිබඳව පරීක්ෂාවන් සිදුකළ අතර, මෙදින සිහි ගැන්වීම සඳහා ආසේමු (කිලි) ආඥාපති විසින් ඒකක පරිශ්‍රයේ අඹ පැලයක් රෝපණය කිරීමට අමතක නොකළේය.

**බුද්ධි අංශය 19 ශ්‍රීලපාහ**







# නව බුදු මැදුරක් ස්ථාපනය කළ 25 ශ්‍රීලපාහ

මෙම ඒකක මුලස්ථානයට අඩුපාඩුවක්ව පැවති අභිනව බුදු මැදුර ඉදි කිරීම වෙනුවෙන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සංකල්පයක් මත හා 611 බළසේනාධිපති බ්‍රිගේඩියර් කේජීඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී අයිජී ගේ මගපෙන්වීමකට අනුව ශ්‍රී ලංකා බෞද්ධ රූපවාහිණී නාලිකාව (ද බුඩිස්) අනුග්‍රහයෙන් රුපියල් 80,000.00 ක වටිනාකමින් යුක්ත ඉතා අලංකාර සමාධි සුවයෙන් වැඩ සිටින අඩි 04 ක් උසැති බුදු පිළිම වහන්සේ නමක් මෙම ඒකකය වෙත පරිත්‍යාග කරන ලදී.

එම බුදු පිළිම වහන්සේ වැඩ සිටවීම සඳහා ඒකකයේ සියලුම නිලයින්ගේ ශ්‍රමදායකත්වයෙන් කිඩාවුර් මුලස්ථානය කඳවුරු භූමිය මධ්‍යයේ ඉතා අලංකාර බුදු මැදුරක් ඉදි කරන ලදී. පිළිම වහන්සේ තැම්පත් කිරීම 2012 වූ වෙසක් පුන් පොහෝ දින සියලුම නිලයින්ගේ සාදු නාදය සමඟින් සුවඳ දුමින් හා පහන් ආලෝකය මධ්‍යයේ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ගේ පින්බර සුරතින් විවෘත කරන ලදී.

**මූලස්ථානය 25 ශ්‍රීලපාහ**















## කාලය

පැයක් කියන්නේ විනාඩි 60 ක් කියලා
විනාඩියක් කියන්නේ තත්පර 60 ක් කියලා
මට ඔයා කියලා දීල තියෙනවා
ඒත් ඔයා නැති තත්පරයක්
කල්පකාලයක් කියල
කවුරුත් මට කියල්දීල නැහැ

සෙ/328752 සාසෙ අබේරත්න ඩබ්ලිව්එම්එන්ඩී
බී කණ්ඩායම - 24 ශ්‍රීලපාහ



## අම්මා!

ලොව උතුම්ද ඔබය
ලොව හිරු සඳුද ඔබය
මේ මිහිතලේ
ගුරුවරයාද ඔබද
යලි බුදු වන්නේ ඔබය
මගේ අම්මාද ඔබය

සෙ/3227494 ලාකෝ ශාන්ත ජේපීයූ
ඩී කණ්ඩායම 1 ශ්‍රීලපාහ

# 1983 ජූලි මස 23 වන දින දේශය වෙනුවෙන් දිවිපිදූ 1 ශ්‍රීලපාහ විරුවන් සැමරීම




පළමුවන ශ්‍රී ලංකා පාබල හමුදාව ක්‍රියාන්විත රාජකාරි සඳහා එවකට යාපනය ප්‍රදේශයේ ස්ථානගතව සිටි අතර, 'සී' කණ්ඩායම ගුරුනගර් හමුදා කඳවුරට අනුයුක්තව රාජකාරි ඉටුකර ඇත. 1983.07.23 දින මෙම ඒකක 'සී' කණ්ඩායමේ නි/50945 2/ලුතිතන් ඒපීඑන්සී ද වාස් ගුණවර්ධන ශ්‍රීලපාහ සමඟ කණ්ඩායමක් වාහන දෙකකින් යාපනය තිරුණෙල්වේලි ප්‍රදේශයේ රාත්‍රි මුර සංචාරක් සිදු කළ අතර, එම කණ්ඩායම වෙත තිරුණෙල්වේලි විශ්ව විද්‍යාලය අසන්නයේදී ඒල්ටීටීඊ සංවිධානයේ සෙල්ලක්කේලී විනර් සහ අප්පයියා සමඟ ත්‍රස්තවාදීන් 25 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් රැකසිට පහරදීමේ ප්‍රහාරයක් එල්ල කරන ලදී. එම ප්‍රහාරයේදී නිලධාරි හා සෙනීන් 12 දෙනා මියයන ලදී. මෙම විරුවන් 1 ශ්‍රීලපාහ හා සමස්ත යුද්ධ හමුදාවේම ඊළාම් ත්‍රස්තවාදය හේතුවෙන් ප්‍රථමයෙන් මියගිය භටපිරිස ලෙස ඉතිහාසගතව ඇත.

මෙම විරුවන් මියගොස් 2012.07.23 දිනට පුරා වසර 29 ක් පිරීම නිමිත්තෙන් 1 ශ්‍රීලපාහ වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ ශ්‍රීලපාහ ඇතුළු සියලුම නිලධාරි හා සෙසුනිලයින් විසින් මියගිය විරුවන් හට පිංපැමිණවීම සඳහා 2012.07.23 වන දින වටරැක ප්‍රදේශයේ පිහිටා ඇති සංහිඳ ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙහි දරු දැරියන් හට උදෑසන ආහාර සහ තෑගි ප්‍රදානය කරන ලදී. එදින සවස පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පිහිටි විහාරස්ථානය වෙත සංඝයා වහන්සේ නමක් වැඩමකරවා බෝධි පූජාමය පිංකමක් පවත්වා මියගිය නිලධාරි හා සෙසුනිලයින් වෙත පිං අනුමෝදන් කරන ලදී.

වීරෝදාර රණවිරුවණි, ඔබ අප අතරින් වියෝවී වසර 29 ක් නොව වසර සිය දහස් ගණනක් ගත වුවද, හිරු නැගයන මොහොතේදීත් හිරු බැසයන මොහොතේදීත් අපි ඔබව සදා සමරන්නෙමු.









බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ



ජූලි මස 09 වන දින පළමු උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සෙ/327243 සාසෙ බණ්ඩාර ආර්ඩබ්ලිව්යු ගේ ආදරණීය දියණිය රචිෂා ගිම්හානි



ජූලි මස 21 වන දින පළමු උපන් දිනය සැමරූ සෙ/212824 ලාකෝ පුනාන්දු ආර්අයිඑඩබ්ලිව් ගේ ආදරණීය දියණිය දුෂ්මි අනුත්තරා



මැයි මස 12 වන දින දෙවන උපන් දිනය සැමරූ 21 ශ්‍රීලපාහ සෙ/21ඩී00325 සාසෙ පතිරණ අයිකේඩී ගේ ආදරණීය දියණිය අනෝද්‍යා විවක්ෂි

1 ශ්‍රීලපාහ සෙ/311054 සැරයන් දිලුක බීජීඩී (ආර්එස්පී) ගේ ආදරණීය දියණියන් මැයි මස 10 වන දින නවවන උපන් දිනය සැමරූ මුතුරංගි කෞශල්‍යා හා මැයි මස 12 වන දින සිව්වන උපන් දිනය සැමරූ නිලක්ෂි කෞශල්‍යා





ජූලි මස 01 වන දින පළමු උපන් දිනය සැමරූ සෙ/319002 සාසෙ චාමික එස්එස්ආර් ගේ ආදරණීය පුතුණුවන් කුමේෂ් එෂාන්






මැයි මස 11 වන දින දෙවන උපන් දිනය සැමරූ 4 ශ්‍රීලපාහ සෙ/314742 කෝප්‍රල් සේනාරත්න ඩබ්ලිව්එච්එම් ගේ ආදරණීය පුතුණුවන් නෙතුජ නිත්මල්

# 20වන ගුණ සැමරුම කර්නල් සීකේජී පුංචිහේවා ආර්එස්පී



කර්නල් සීකේජී පුංචිහේවා ආර්එස්පී ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ සිටි අති දක්ෂ අවංක ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි. 4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරමින් සිටියදී 1992 ජුනි මස 10 වන දින රුදුරු ත්‍රස්තවාදීන්ගේ පීඩන බෝම්බයකට හසුවී රට දැය වෙනුවෙන් දිවි පුදන ලදී. රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හී ප්‍රථම විධායක අධිකාරි වශයෙන් රාජකාරී කර ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද හමුදාවේ විවිධ තනතුරු රාශියක් දරා ඇත.

2012.06.10 වන දින සීකේජී පුංචිහේවා මැතිණිය හා ඥාතීන්, හිත මිතුරන් එක්ව 20 වන අවුරුදු ගුණ සමරු උත්සවයක් පැවති අතර, එපින් බලයෙන් එතුමන් හට අජරාමර නිවස් සුව අත්වේවා.





# 25 ශ්‍රීලපාහ ගොවිබිම





25 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව දැනට ආසේමු (ව) බළප්‍රදේශයට අයත් 61 වන සේනාංකය යටතේ 611 බළසේනාවට අනියුක්තව කිඩාචුර් වව්නියාව ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරී කරනු ලබයි. මෙම ප්‍රදේශයේ වර්ග කිලෝ මීටර් 187ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි හටපිරිස් රාජකාරි කරනු ලබන අතර, ඒකකයේ නිලධාරි හා සෙසුනිලයින්ගේ සුබසාධක කටයුතු සඳහා වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ගේ මග පෙන්වීම යටතේ වගා කටයුතු කිරීමට සැළසුම් කළහ. අනතුරුව ප්‍රථමයෙන් බළඇණි මූලස්ථාන කඳවුරට යාබද අක්කර 1 1/2 බිම් ප්‍රදේශයක වගාවන් සඳහා මූලික බිම් සැකසීම් සිදු කර එහි බඩඉරිගු වගාවක් හා වට්ටක්කා වගාවක් ආරම්භ කරන ලදී.

පවත්නා අධික වියළි කාළගුණික තත්ත්වය මත වගාවන් සිදු කළ නොහැකිව තිබියදීත් මෙම ඒකක සෙබළුන්ගේ අප්‍රතිහත ධෛර්යය හා කැපවීම මත ජලය වගාබිමට ගෙනවිත් ඉතා සරුසාර ඵල දරන වගාවක් ලෙසින් අස්වද්දන ලදී. මෙම ප්‍රදේශයේ උපන්දා සිට වගාවන් කළ ගොවීන්ටද මෙම වගාව ආන්දෝලනාත්මක හැඟීම් උපද්දවන්නට විය.

**මූලස්ථානය 25 ශ්‍රීලපාහ**

# රෙම ශ්‍රීලපාහ ජූඩෝ සංචිතයේ ජයග්‍රහණ



2012 ජූලි මස 27දින සිට 29 දින දක්වා ගම්පොළදී පැවති සමස්ත ලංකා ආධුනික ජූඩෝ තරඟාවලියේ පිරිමි අංශයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද හමුදාවට හිමිවිය. ශ්‍රී ලංකා ජූඩෝ සංගමය සංවිධානය කළ තරඟා වලියේදී රෙම ශ්‍රීලපාහ ජූඩෝ සංචිතයෙන් සහභාගී වූ ක්‍රීඩකයෝද දස්කම් දැක්වූහ. සෙ/9ඞී00272 ලාකෝ සෝමසිරි එම්කේ (කලුපටි දෙවන ශ්‍රේණිය) ගේ උපදේශකත්වය යටතේ පුහුණුව ලබන මෙම ක්‍රීඩකයන් ලබාගත් ජයග්‍රහණ මෙසේය. කිලෝ ග්‍රෑම් 50 බර පන්තියේ තුන්වන ස්ථානය සෙ/321028 ලාකෝ බණ්ඩාර ජීජීසී (4 ශ්‍රීලපාහ), කිලෝ ග්‍රෑම් 55 බර පන්තියේ තුන්වන ස්ථානය සෙ/328828 සාසෙ බණ්ඩාර අයිඩී (10 ශ්‍රීලපාහ), කිලෝ ග්‍රෑම් 60 බර පන්තියේ තුන්වන ස්ථානය සෙ/330721 සාසෙ තෙන්නකෝන් ඩබ්ලිව්ජ්එස් (20 ශ්‍රීලපාහ) හා එම බර පන්තියේ දෙවන ස්ථානය මෙන්ම කණ්ඩායම් තරගාවලියේ රන් පදක්කම සෙ/329101 සාසෙ ජයසිරි ආර්පීඅයි (1 ශ්‍රීලපාහ) විසින් දිනා ගන්නා ලදී. කිලෝ ග්‍රෑම් 73 බර පන්තියේ තුන්වන ස්ථානය සෙ/327761 සාසෙ කුමාරසිරි ටීඩීපී (20 ශ්‍රීලපාහ) සහ කිලෝ ග්‍රෑම් 81 බර පන්තියේ තුන්වන ස්ථානය සෙ/319608 ලාකෝ චන්දන කීර්ති ටීඑච් (10 ශ්‍රීලපාහ) දිනා ගත්හ. රෙම ශ්‍රීලපාහ ජූඩෝ කමිටුවේ සභාපති ලුතිතන් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ, උප සභාපති මේජර් කේපීඑල් අමුණුපුරේ ආර්එස්පී ශ්‍රීලපාහ සහ ලේකම් මේජර් ටීපී වීරසිංහ ශ්‍රීලපාහ යන නිලධාරින්ගේ අධීක්‍ෂණය යටතේ රෙම ශ්‍රීලපාහ ජූඩෝ පුහුණු සංචිතයේ පුහුණු කටයුතු ශ්‍රී ලංකා ජූඩෝ සංගම් ශාලාවේදී සිදුකෙරේ.

**මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ (කලුපටි පළමු ශ්‍රේණිය)**
**ගරු ලේකම් - රෙම ශ්‍රීලපාහ ජූඩෝ කමිටුව**

# 15 වන ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලිය - 2012

ආසියානු මලල ක්‍රීඩා සංගමය හා ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය මගින් සංවිධානය කරනු ලැබූ 15 වන ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලිය 2012 ජුනි මස 09 දින සිට 12 වන දින දක්වා කොළඹ සුගතදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. මේ සඳහා ආසියානු කලාපයේ රටවල් 33 ක් නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 800 ක් පමණ සහභාගි වූ අතර, ශ්‍රී ලංකා නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 104 දෙනෙකු සහභාගි වන ලදී.



මෙම තරඟාවලිය සඳහා අප රෙජිමේන්තුවේ ක්‍රීඩා අංශයේ ප්‍රධාන ලිපිකරු වශයෙන් රාජකාරි කරනු ලබන 5(සෙච්) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/5ඩී03265 සැරයන් සිරිවර්ධන එච්එම්එන් ගේ දියණිය එච්එම්එන් නිමේෂා මධුෂානි සිරිවර්ධන ක්‍රීඩිකාව මෙම තරඟාවලියේදී උස පැනීමේ ඉසව්ව නියෝජනය කරමින් මීටර් 1.79 ක උස ප්‍රමාණයක් වාර්තා කරමින් රිදී පදක්කම ලබාගන්නා ලදී. රන් පදක්කම හිමි කරගත් චීන ජාතික ක්‍රීඩිකාව ද වාර්තා කළ උස මීටර් 1.79 ක් විය. එකම උස ප්‍රමාණය මෙම ක්‍රීඩිකාවන් දෙදෙනා වාර්තා කළත් ජාත්‍යන්තර නීතිරීති වලට අනුව එක ක්‍රීඩිකාවකට තරඟ වාර අවස්ථා 03 ක් හිමි වන ලද අතර, නිමේෂා මධුෂානි ක්‍රීඩිකාව එම උස දෙවන අවස්ථාවේදී වාර්තා කිරීම නිසා දෙවන ස්ථානය හිමි විය.

පසුගිය දා දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේදී පැවති ශ්‍රී ලංකා කනිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කරමින් නිමේෂා ක්‍රීඩිකාව එම තරඟාවලියේ නව වාර්තාවකටද හිමිකම් කියමින් මීටර් 1.80 ක උස වාර්තා කළ අතර, ඒ අනුව ඇය ජූලි මස 07 වන දින ස්පාඤ්ඤයේ බාසිලෝනා නගරයේ පැවැත්වීමට නියමිත ලෝක ශූරතා කනිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීමට අවශ්‍ය කඩඉම සම්පූර්ණ කළේය.

පසුගිය වසරේ පැවති යුද හමුදා අන්තර් රෙජිමේන්තු විරුදරු ක්‍රීඩා තරඟාවලියේදී කැපී පෙනෙන දක්ෂතා දක්වමින් අප රෙජිමේන්තුව තෙවන ස්ථානයට ගෙන ඒමට මෙම නිමේෂා මධුෂානි ක්‍රීඩිකාව විශාල දායකත්වයක් දක්වන ලදී. 15 වන ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියේදී දක්වන ලද දක්ෂතා හේතුවෙන්ම ඇයට රිදී පදක්කමට හිමිකම් කීමට හැකි වීම ක්‍රීඩා ඇමති මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ සහ ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපති හා යුද හමුදා මලල ක්‍රීඩා සංගමයේ සභාපති මෙන්ම අප රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමාගේ ද පැසසුමට ලක්විය.





මෙවන් රණවිරු දරුවන් බිහි කළ දෙමාපියන් මෙන්ම ඔහු සේවය කරණ රෙජිමේන්තුවට සමස්ත යුද හමුදාවට හා ශ්‍රී ලංකාවට ඇය වාසනාවකි. ඇයගේ ඉදිරි ක්‍රීඩා දිවිය තුළ තව තවත් ජයග්‍රහන ලබාගනිමින් ලක්මව රනින් බබලවන්නට හැකිවේවා! යි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු. ඔබගේ ජයග්‍රහන අප රෙජිමේන්තුවට මෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාවටත් ආඩම්බරයක් මෙන්ම ගෞරවයකි.

**රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය**

## ආදරණීය අම්මාට වදනක්

අම්මේ නුඹ සඳක් වෙලා දිලේනම්
මම සඳක් වෙලා එළිය දුන්නේ
ඔබේ හිරු නෙතු යුගලයි
ගඟක් වෙලා ගලන්නම්
මම ගඟක් වෙන්න
සවියක් වුනේ ඉව්රක් වී ඔබමයි
සමනලයෙකු වී ඉගිලෙමි
අත්තටු දී ඉගිලෙන්නට

වරම් දුන්නේ ඔබයි
මලක් වෙලා පිපුනෙමි මම
මලක් වෙලා සුවඳ වෙන්න
ගසක් වුනේ ඔබමයි
මිනිස් ලොවේ ඉපදුණු මට
මිනිසත් බව පතුරන්නට
මන් හසුරක් කියා දුන්නේ
අම්මේ ඔබ පමනයි



ලාකෝ නවරත්න ඒජීආර්යූ 'සී' කණ්ඩායම - 8 ශ්‍රීලපාහ

# දසුනේ හසුන

හසුන  ඃ

තුන් දශකයක් පැවති යුද සමයේදී අප හෙළු ලේ ගඟෙන්
දැන් මගේ රට මුදාගෙන ඇත කියමි මම අම්මේ අගෙන්
තුන් හෙලේ මව්වරුන් ඔබ වැනි සෙත් පතා බුදු සමිඳුගෙන්
පින් පතා රණවිරුවන් සිහි කළ ඔබට දැන් කළ ගුණ මගෙන්

දන් සැලෙට ආ පිරිස අතරේ ඔබව තනි විය රියක් තුළ හිඳ
මන් දුටුවේ ඔබ මගේ මෑණිය ලෙසයි මා වැදූ මහා දුක් විඳ
දැන් නැගෙන ඔය සිනහ මුවගෙන් දැනෙයි තිබෙනා සතුට හද බැඳ
යන් ඉතින් දන්සැල වඩිමු අපි මෙන්න ඇරයුම ඔබේ පා වැඳ

සෙ/329809 සාසෙ උදය කුමාර පීඑල්ආර් - තුවාක අංශය ශ්‍රීලපාහ

දසුන ඃ

වෙසක් පුන් පොහොදින 24 ශ්‍රීලපාහ ඒකකය වෙතින් පැවැත් වූ නූඩ්ලස් දන්සල වෙත පැමිණි වයෝවෘද්ධ මවකට අත්වැල් අල්ලන 24 ශ්‍රීලපාහ විරුවෙක්



## ප්‍රහේලිකා අංක 53

නිවැරදි විසඳුම්පත් 2013 ජනවාරි මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 53

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 5 | 1 | 6 | | 9 | 3 | 8 | |
| 9 | | 4 | 1 | | 3 | 5 | | 6 |
| 3 | 2 | | 5 | | 8 | | 9 | 1 |
| 2 | 4 | 7 | | 5 | | 8 | 1 | 9 |
| | | | 4 | | 7 | | | |
| 6 | 1 | 3 | | 8 | | 7 | 5 | 4 |
| 4 | 6 | | 8 | | 1 | | 2 | 7 |
| 1 | | 2 | 7 | | 5 | 6 | | 8 |
| | 7 | 9 | 2 | | 4 | 1 | 3 | |

### ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පුර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පුර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 50

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | 2 | 9 | 3 | 8 | 6 | 5 | 4 | 1 |
| 6 | 4 | 8 | 9 | 1 | 5 | 2 | 7 | 3 |
| 5 | 1 | 3 | 2 | 7 | 4 | 8 | 6 | 9 |
| 1 | 8 | 7 | 5 | 2 | 3 | 4 | 9 | 6 |
| 2 | 6 | 4 | 8 | 9 | 7 | 1 | 3 | 5 |
| 3 | 9 | 5 | 6 | 4 | 1 | 7 | 2 | 8 |
| 8 | 3 | 2 | 4 | 5 | 9 | 6 | 1 | 7 |
| 9 | 5 | 1 | 7 | 6 | 2 | 3 | 8 | 4 |
| 4 | 7 | 6 | 1 | 3 | 8 | 9 | 5 | 2 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගී දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 53 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ,
හෝමාගම.

# මෙවර ජයග්‍රාහකයෝ

**ප්‍රථම ස්ථානය**

සෙ/318946 ලාකෝ චින්තක මිහිර ඊඑම්
රෙජිමුබ ශ්‍රීලපාහ,
යුද හමුදා ජනපදය,
පනාගොඩ.- හෝමාගම.

**දෙවන ස්ථානය**

සෙ/21ඩී00262 කෝප්‍රල් වීරවර්ධන පීඩීඩබ්ලිව්එන්,
21 (සෙව්) ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
ආලන් කුලම් . තුණුක්කායි.

**තුන්වන ස්ථානය**

සෙ/2010වීඑෆ්ආර්ඩී66369 ලාකෝ අබේකෝන් පීඑන්එෆ්,
21 (සෙව්) ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
ආලන් කුලම් . තුණුක්කායි.

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**53**

### කූපනය

අංකය : ..............................................................

නිලය : ..............................................................

නම : ..............................................................

රාජකාරී ලිපිනය : ..............................................................

..............................................................

..............................................................

ඒකකය : ..............................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................

# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY

අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරින් හා සෙබළුන් 3807 දෙනෙකු සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.









# පාබල හමුදා රෙජිමේන්තු අධිපතිගේ ශ්‍රීලපාහ ඒකක සංචාරය

ශ්‍රී ලංකා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී හා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු පීඑස්සී පාලන සාකච්ජාවක් සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙත 2012.07.20 දින පැමිණෙන ලදී. එම සංචාරය අවසානයේදී මුලතිව් ප්‍රදේශයෙහි ස්ථානගතව ඇති 4 ශ්‍රීලපාහ මූලස්ථානය මුල්ලියාවේලි කඳවුර වෙතද පැමිණීමට අමතක නොකළහ. එතුමන්ව අණදෙන නිලධාරි මේජර් ජීඩීජේසී ප්‍රේමතිලක ශ්‍රීලපාහ විසින් පිළිගැනීමෙන් පසු සම්මාන මුරයක් ද ඒකකය වෙතින් පිරිනමන ලදී.

එතුමන්ගේ මෙම ඒකක සංචාරය සනිටුහන් කිරීම සදහා 4 ශ්‍රීලපාහ බළඇණි මූලස්ථාන කදවුරෙහි අඹ පැලයක් රෝපණය කරන ලදී. රෙජිමේන්තු අධිපතිතුමා නිලධාරි නිවස්නයෙහි වෙතින් උදෑසන ආහාරය භුක්ති විදි අනතුරුව සමරු සටහනක්ද තබමින් එතුමා නික්ම ගිය අතර, ආසේමූ (මුලතිව්) බලප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ශ්‍රීලපාහ ඒකකයන් හි හටපිරිස් ඇමතීම මුලතිව් විද්‍යානන්ද විද්‍යාලයේදී සිදු කරන ලදී.



**බුද්ධි අංශය 4ශ්‍රීලපාහ**

# 2012 අන්තර් රෙජිමේන්තු ආධුනික මලල ක්‍රීඩා තරගාවලියේ
# ශූරතාවය දිනූ ශ්‍රීලපාහ කණ්ඩායමට
# රෙජිමේන්තු අධිපති තුමා ඇතුළු සියලුම අයවලුන්ගේ උණුසුම් සුබ පැතුම්

